ලංකාදීප
සඳැල්ල
2022 මාර්තු 13




ඡායාරූපය - සජීව ලක්ෂාන්
පිටු සැකසුම - පසන් සෙනෙවිරත්න
හැඩගැන්වීම - නිරෝෂා රණසිංහ

# නළුවෙක් වෙන්න අම්මා ආශිර්වාද කළේ නෑ

**ශ්‍රී ලාංකීය සිනමාවේ රනින් මතකයක් රැන්දූ දක්ෂතා රැසකින් පරිපූර්ණ රංගධරයකු ලෙසින් සනත් ගුණතිලක නම් ඔහුව හඳුන්වා දිය හැක කඩවසම් නළුවෙක් වූ චිත්‍රපට අධ්‍යක්ෂවරයකු නිෂ්පාදකවරයකු ලෙස බොහෝ ආදරණීය ගෞරවයට පාත්‍ර වන ඔහුව සොයා අපි ගියෙමු. රහස් සාකච්ඡාවට අපි මෙවර ඔහුට ආරාධනා කළෙමු.**

**• මොනවද මේ දිනවල කෙරෙන්නේ?**
නවතම ආරෙක චිත්‍රපටයක් මා අතින් මේ දිනවල අධ්‍යක්ෂණය කෙරෙනවා.

## ප්‍රේමය විවාහයකින් කෙළවරවිය යුතු නෑ



**• ඔබට රඟපෑමටද වඩාත් කැමැති දේශපාලනයට ද?**
මගේ පළමු කැමැත්ත වගේම සියවන කැමැත්තත් රංගනයට .මම දේශපාලනය කළෙත් බොහොම සතුටින්.
නමුත් ඊටත් වැඩිය කැමති දේශපාලනයෙන් ඉවත් වීමට සිදුවීම ගැන.

**• පුංචි කාලේ ඉඳලාම නළුවෙක් වෙන්න ද සිහින මැව්වේ?**
නැහැ. මම නම් සිහින දැක්කේ වෛද්‍යවරයෙක් වෙන්න.නමුත් අම්මගේ නං කැමැත්ත තිබුණෙ පොත්පත් ආශ්‍රිතව රැකියාවක් මම කරනවා දකින්න... හීනෙකින්වත් හිතපු නැති වෘත්තීන් වලයි මා නියැළුණේ.

**• අම්මා ඔබ තෝරාගත් වෘත්තිය ගැන අපහැදීමෙන්ද හිටියේ?**
සමහර විට මට දැනුනු විදිහට මගේ රඟපෑම් ජීවිතයට අම්මගෙන් ආශිර්වාදයක් ලැබුණේ නැහැ ..නමුත් ඇය කවදවත් අකුල් හෙලලාත් නැහැ ...තාත්තා ඊට හාත්පසින්ම වෙනස්. මගේ රංගන දක්ෂතාවයන් දකින හැම වෙලාවකම ඔහු අප්‍රමාණ සතුටක් ආඩම්බරයක් ලැබුවා.

**• ජීවිතයට පාළුවක් තනිකමක් දැනෙන්නේ නැද්ද?**
තවම නම් එහෙම දෙයක් දැනිලා නැහැ.

**• ඔබ විවාහ නොවී ඉන්න තීරණය කරන්නේ?**
ඇත්තට ම මම විවාහ නොවී ඉන්න බලපාපු හේතුව මම තාමත් හොයනවා.

**• විවාහ යෝජනා කොච්චර විතර ලැබිලා තියෙනවද?**
ගණන් කරලා නම් නැහැ.
නමුත් අදටත් එදා වගේම විවාහ යෝජනා එනවා. මට යෝජනා එනවා වගේම මමත් ඇතැම් යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා.
සමහර විවාහ යෝජනා ඉදිරිපත් කර තිබුණේ රඟපෑම අත හැරලා විවාහ වෙන ලෙසට.
තවත් විවාහ යෝජනා එක්ක මරණ වරෙන්තු පවා ඇවිත් තිබුණා.

**• ඔබ තවමත් ආදරය කරනවාද?**
ඔව්.
මැරෙනකම්ම.
අවබෝධාත්මක ආදරණීය ප්‍රේමයක් ජීවිතයේ ඉදිරි කාලය මාව ජීවත් කරවයි කියලා මට ලොකු විශ්වාසයක් තියෙනවා.

**• ඒ කිව්වේ ඔබ ඉදිරියේදී විවාහ වෙනවාද?**
"ප්‍රේමය " විවාහයකින් නිම විය යුතුයි කියා රීතියක් කොහෙවත් නෑ නේද

**• වයසට යන එක නතර කරලා ද?**
අපෝ නෑ. දැන් මට වයස අවුරුදු හැට පහක්.

**• තවමත් කොල්ල වගේ ඉන්න රහස මොකක්ද?**
මාව දකින හැමෝම ඔය ප්‍රශ්නය මගෙන් අහනවා .ඇත්තටම ඒ වෙනුවෙන් විශේෂ දෙයක් නම් කෙරෙන්නේ නැහැ. නමුත් යම් විදිහකට හිත සන්සුන් කරගෙන, හිත සැහැල්ලු වෙන් තියාගෙන සතුටින් ඉන්න කොට අපි නොදැනුවත්වම අපේ බාහිර පෙනුම ප්‍රියමනාප වෙන බව මම විශ්වාස කරනවා. ඒ හැරෙන්න ලෙඩ වෙන එක වයසට යන එක වැනි පොදු ධර්මතාවයන්ට මමත් මුහුණ දෙමින් සිටිනවා.

**• කෑම බීම ගැන පොදුවේ සැලකිලිමත්ද?**
වයසත් එක්ක පොඩි සැලකිල්ලක් නං තියෙනවා. නමුත් ලොකුවට සැලකිල්ලක් නැති නිසා සමහර වෙලාවට වෛද්‍යවරු පවා කියනවා ඔයාව බලාගන්න කවුරුහරි හිටියා නම් හොඳයි කියලා ...

**• ඔබට වඩාත් ම ගැළපෙන ඇඳුම?**
සරමටයි කමිසයටයි කඩවසම් පෙනුමක් තියෙනවා .සමහර වෙලාවට කලිසම ඇඳන් තැනකට ගියොත් කට්ටිය අහනවා ඇයි කලිසමක් ඇඳේ කියලා ....

**• ඔබේ ශරීරයට වඩාත් ගැලපෙන පාට?**
රතු, දම්, කහපාට මම ගොඩක් කැමැතියි.

**• විනෝදාංශ මොනවාද?**
විවිධ විෂයයන් යටතේ ලියවුණු පොත්පත් කියවන්න මම ගොඩක් ආසයි .ඊට අමතරව පැත්තකට වෙලා ලොකු කල්පනාවක වැටිලා ඉන්න එකෙනුත් ලොකු විනෝදයක් ලබනවා.

**• ඔබ වඩාත් කැමැති නිළිය?**
මම වඩාත් කැමැති නිළිය අයිරාංගනී සේරසිංහ. නමුත් මා සමඟ රඟපෑ නිළියන්ගෙන් මා වඩාත්ම කැමති ගීතා කුමාරසිංහට.
ගීතා සමඟ මොන රංගනයේ යෙදුනත් තාත්විකයි. ආදරණීයව රඟපෑවත්, රණ්ඩු උනත් සජීවීයි.

**• වාසනාව ලැබීම ගැන ඔබ විශ්වාස කරනවද?**
ඔව්. යම්තාක් දුරකට විශ්වාස කරනවා .මමත් වාසනාවන්තයි කියලා හිතෙනවා.

**• රන් ආභරණ පලඳින්න කැමතිද?**
කැමතියි. ඉස්සර මගේ ඇඟිලි 10ටම මුතු දාගෙන හිටියා ...

**• නළුවෙක් විදිහට ආඩම්බරයක් හිතට දැනිලා නැද්ද?**
කවදවත් එහෙම දෙයක් හිතට දැනිලා නැහැ. නමුත් මා රංගධරයකු ලෙස ආදරයක් ගෞරවයක් ලැබෙන හැම වෙලාවකම පෞද්ගලික මා තෝරාගත් වෘත්තිය ගැන අප්‍රමාණ සතුටක් ලැබෙනවා .ඒ හැරෙන්න කිසිදක වෘත්තීය තුළින් ආඩම්බරයක් සිතට දැනිලා නැහැ.

**• රඟපෑම තුළින් ඔබ වඩාත්ම ජනාදරයට පාත්‍ර වන්නේ?**
මා රඟ පෑමට පිවිසෙන්නේ 1978 වසරේ දී. නමුත් බොහෝ දෙනෙක් මාව හඳුනා ගන්නේ 80 දශකයේ .ගඟ අද්දර, විරාගය, දෙවෙනි ගමන, නැවත හමුවෙමු ,වැනි චිත්‍රපටි රාශියක් මගේ රංගන ජීවිතයේ හැරවුම් ලක්ෂ බවට පත් වුණා.
සනත් සබීතා යුගයක් කාලයක් නිර්මාණය වී තිබුණා.ඇතැම් චිත්‍රපටි ප්‍රේක්ෂකයන් මා හිස පීරන විදියට හිස පීරන්න ,මා ඩෙනිම් කලිසම් අඳින විදිහට විලාසිතා වලට යොමු වෙන්න වැඩි කැමැත්තක් දක්වපු බව දැන ගන්න ලැබුණා .

**• ජීවිතය ගැන මොකද හිතෙන්නේ?**
ජීවිතය ගැන ඇත්තටම විග්‍රහ කරන්න අමාරුයි. නමුත් මා නියැලෙන වෘත්තීන් දෙකේදී මා ලබපු අත්දැකීම් එක්ක වසර සියයකට වඩා දැනීමක් ලැබුවා කියලා නම් හිතෙනවා.

**• ජීවිතේ සංවේදී වුණු ම අවස්ථාව?**
මගේ අම්මයි තාත්තයි බොහෝම ආදරයෙන් සෙනෙහසින් හිටපු දෙන්නෙක්.
මාගේ පියාගේ මරණ ය මොහොතේදී, මාගේ මෑණියන් දේහය නිවසින් ගෙන යන්න මොහොතකට කලින් පියාගේ හිස පිරි මැද නළල සිපගෙන උපදින හැම ආත්මයකදීම" ඔයා මගේම වෙන්න කියලා" කියපු වචන මගේ හදවතට අදටත් මහ වේදනා බරිත බවක් ගෙන දෙනවා ....



## විවාහ යෝජනා තවමත් එනවා



## සනත් ගුණතිලක


අසුන්තා එදිරිසූරිය



# උසස් පෙළ අවසන්... දැන්

# නීතීඥ වෘත්තියට

## ප්‍රවේශ වීමට කාලයයි.

**1 නීති විද්‍යාල ප්‍රවේශය**
Law College Entrance
තුළින් නීතීඥ වෘත්තියට

**2 විවෘත විශ්ව විද්‍යාල LL.B ප්‍රවේශය**
Open University LL.B Entrance
තුළින් නීතීඥ වෘත්තියට

ZOOM ඔස්සේ

**සම්පූර්ණයෙන්ම නොමිලේ**

**අලුත්ම පන්ති ආරම්භය**

මාර්තු **20**

**ඉරිදා උදෑසන 8.00 ට**

සම්මන්ත්‍රණය සහ ඉගැන්වීම ආදර්ශ ප්‍රශ්න පත්‍ර ආරම්භ කිරීම සිදුකෙරේ.

අලුත්ම නීති පන්තියට සම්බන්ධ වී නීතීඥ වෘත්තියට යාමට කැමති සැමදෙනාම පහත Telegram සමූහයට එකතු වන්න. ඒ හරහා ඔබට ඉදිරි පියවරයන් දැනුම් දෙනු ඇත. පහත Telegram ගිණුමට සම්බන්ධ වීම අනිවාර්ය බව සලකන්න. ඔබ Telegram app එක download කරගෙන එහි t.me/Shammikalawacademy_2022 type කරමින් අප Telegram සමූහයට එකතු වන්න.

## නීතීඥ වෘත්තියට ඔබගේ ගමන්මග සරල සටහනකින්

පහත ක්‍රමවේද 2 න් 1 ක් හෝ 2 ම හෝ යොදාගෙන ඔබට නීතීඥ වෘත්තියට ඒමට උත්සාහ දැරිය හැක

මේ විභාග දෙක සඳහාම වයස් සීමාවක් අදාල නැත. (Law College Entrance සහ LL.B Entrance යනු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන රජයේ විභාග 2 කි)

### 1 නීති විද්‍යාල ප්‍රවේශය හරහා ඔබගේ ගමන්මග



A/L අවම C2, S1 (ඕනෑම විෂය ධාරාවකින් මෙවර A/L ලියා ප්‍රතිඵල අපේක්ෂිත ඔබටත්) O/L ඉංග්‍රීසි, සිංහල අවම C

↓

Law College Entrance (විභාග දෙපාර්තමේන්තුව විසින් විභාගය පවත්වයි)

↓

Law College (ශ්‍රී ලංකා නීති විද්‍යාලය)

↓

නීතීඥ වෘත්තිය →

ශ්‍රේෂ්ඨාධිකරණ නීතීඥ
ප්‍රසිද්ධ නොතාරිස්
දිවුරුම් කොමසාරිස්
සමාගම් ලේකම්

### 2 විවෘත විශ්වවිද්‍යාලයේ නීති පීඨය හරහා LL.B Entrance තුළින් නීතීඥ වෘත්තියට පැමිණීමේ ගමන්මග



A/L අවම S3 (ඕනෑම විෂය ධාරාවකින්) මෙවර A/L ලියා ප්‍රතිඵල අපේක්ෂිත ඔබටත්) (LL.B Entrance සඳහා O/L සුදුසුකම් අදාළ නැත)

↓

LL.B Entrance (විභාග දෙපාර්තමේන්තුව විසින් විභාගය පවත්වයි)

↓

විවෘත විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ වසර 4ක LL.B උපාධිය හැදෑරීම (සති අන්ත දේශන)

↓

නීතීඥ වෘත්තිය →

ශ්‍රේෂ්ඨාධිකරණ නීතීඥ
ප්‍රසිද්ධ නොතාරිස්
දිවුරුම් කොමසාරිස්
සමාගම් ලේකම්
(LL.B ශ්‍රී ලංකා)

A/L ප්‍රතිඵල එනතෙක් නොසිට නිවසේ සිට නීතිය ඉගෙන...

## නීතීඥ වෘත්තියට ඉක්මන් ප්‍රවේශය

දිවයිනේ වැඩිම සිසුන් පිරිසක් සහභාගී වන Online Law පන්තිය



නීතීඥ
# ශම්මික වික්‍රමසිංහ
Attorney at Law (ශ්‍රේෂ්ඨාධිකරණ නීතීඥ)

076 65 64 284
071 39 56 105 සහ 071 43 57 101
Shammika Wickramasingha | Shammika Sir
Shammika Sir

### Online Law පන්තියට ලියාපදිංචි වන ආකාරය

(1) ඔබගේ නම, Phone No, ID No: 071 39 56 105 සහ 071 43 57 101 යන අංක දෙකටම whatsapp කරන්න.

(2) අප ආයතනයේ නිළධාරිණියක් පැය 48ක් ඇතුලත ඔබට අමතනු ඇත. අවශ්‍ය සියලු විස්තර සහ අප www.gurumandala.lk වෙබ් අඩවියේ ඔබව ලියාපදිංචි කරවීම ඇය විසින් කරදෙනු ඇත.

(3) ඉන්පසු ඔබගේ Profile එකට ගොස් Trial videos බැලීමට Lessons බොත්තම ද නිබන්ධන ගැනීමට Assignment බොත්තම ද භාවිතා කරන්න.

SIYATHRA 074 1160010

**අපගේ Online පන්තියේ සුවිශේෂී ප්‍රයෝජන**

(1) Live පාඩම අතපසු වුවහොත් recording බැලීමට ඇති හැකියාව.
(2) Recording ඕනෑම වාර ගණනක් බැලීමේ හැකියාව.
(3) Zoom හරහා live උගන්වන බැවින් අඩුබිල data package භාවිතා කිරීමට හැකිවීම.
(4) Live ආදර්ශ විභාග වලට මුහුණ දී තම මට්ටම මැන ගැනීමට ඉඩ ලැබීම
(5) සියලු විෂය කොටස් එක දිනයක දී වැඩි පැය ගණනක් ඉගැන්වීමේ හැකියාව. (දිනකට පැය 8ක් හෝ ඊට වැඩි කාලයක්)

# 'අන්සතු ඔබ' හැරවුම් ලක්ෂයයි

**'නාඩගම්කාරයෝ' වෙනුවෙන් අලුතින්ම එකතු වුණු 'ගීතානි මිස්' මේ දිනවල බොහෝ දෙනෙක් කතාබහ කරන චරිතයක්. ඒ නිසාම ඇය සමගින් කතාබහක යෙදෙන්නට සඳැල්ලෙන් ඉඩක් වෙන් කරන්න හිතුවා. ඇය නමින් නිපුණි පූජිතගුණවර්ධන.**

**• නාඩගම්කාරයෝ වෙනුවෙන් රංගනයෙන් එකතු වුණු අලුත්ම චරිතය ගීතානි මිස්ට හොඳ ප්‍රතිචාර තියෙනවා නේද?**

"ඔව්. ඇත්තටම හිතුවෙවත් නැති තරමට ප්‍රතිචාර තියෙනවා. ඒ ගැන ගොඩක් සතුටුයි. 'නාඩගම්කාරයෝ' කියන්නේ මීට වසරකට පෙර වගේ ආරම්භ වුණු නිර්මාණයක්නේ. ඉතින් මට ඒ වෙනුවෙන් සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබෙන්නේ මීට මාස දෙක තුනකට පෙර වගේ. ඒ විදිහට නිර්මාණය මැදදී එකතු වෙන්න ලැබුණත් ඉතා ඉහළ ප්‍රතිචාරයක් මට ලබාගන්න හැකි වුණා."

**• ඉතින් මේ චරිතය ගැනත් කියමු?**

"ගීතානි කියන්නේ සංවර්ධන නිලධාරිනියකගේ චරිතයක්. ඇය තමන්ගේ සේවාව රාජකාරිය අකුරටම ඉටු කරන කෙනෙක්. ගමේ කිසිදු හව්හරණක් නොමැතිව ජීවිතේ නිකරුණේ ගෙවාගෙන ගිය තරුණ පිරිසකගේ වටිනාකම තේරුම් අරගෙන ඔවුන්ට කරන්න පුළුවන් දේ තේරුම් අරගෙන ජීවිතේ ගොඩනගාගන්න අත දෙන නිලධාරිනියක් ගීතානි. ඉතින් පෞද්ගලිකවත් මම මේ චරිතයට ගොඩක් කැමැතියි. හොඳ ප්‍රතිචාරත් මේ වෙද්දි ලැබෙනවා."

**• ගීතානිට බණින පිරිසකුත් ඉන්නවා නේද?**

"ඔව්. ඇත්තටම මේ කතාවේ ප්‍රධාන චරිත වන සුදු චූටිගෙයි සරාගෙයි අතර ප්‍රේමයක් තියෙනවානෙ. ඒ දෙන්නා රහසින් ආදරය කරනවා. ඉතින් ඒ ආදරය මැද්දට එන්න හදනවා කියලා මට බණින පිරිසක් ඉන්නවා. නමුත් ඒ වගේ සිදුවීමක් වෙයි කියලා මම හිතන්නේ නම් නැහැ. ඉතින් චරිතෙ සිදුවීම් තවම දන්නෙත් නැහැ. කොයි විදිහට වෙනස් වෙයි ද කියලා ඉදිරියේදී තමයි ඒ ගැන බලන්න වෙන්නේ."

**• අන්සතු ප්‍රේම කතාවලමයි පැටලෙන්න හදන්නේ කියලා ප්‍රතිචාර දක්වපු පිරිසක් හිටියා නේද?**

"ඔව්නේ. ඒකට හේතුව මාව ගොඩක් දෙනෙක් හඳුනාගන්නේ පසුගිය කාලේ ගොඩක් ජනප්‍රිය වුණු 'අන්සතු ඔබ' මියුසික් වීඩියෝව නිසානේ. ඉතින් ඒ මියුසික් වීඩියෝව ගැනත් අපේ රංගනය ගැනත් ගොඩක් දෙනෙක් කතා කළා. ඇත්තම කියනවා නම් ඒ වීඩියෝව මගේ ජීවිතේ හැරැවුම් ලක්ෂයයක්. ඒ වෙනුවෙන් ලැබෙන ප්‍රතිචාර අදටත් අඩුවක් නැහැ. ඉතින් ඒ රංගනයේදි ගොඩක් දෙනා දක්වපු ප්‍රතිචාරවල සඳහන් කරලා තිබුණේ තාත්වික රංගනයක් ඉදිරිපත් කරලා තිබුණා කියන දේ. ඇත්තටම කියනවා නම් මේ වෙනුවෙන් සම්බන්ධ වුණු මේ කණ්ඩායමේ කවුරුත් හිතුවේ නැහැ මේ තරම් අතිවිශාල ප්‍රතිචාරයක් ලැබෙයි කියලා. නමුත් අපි මේ නිර්මාණය වෙනුවෙන් උපරිමෙන් මහන්සි වෙලා වැඩ කළා. ඒ මහන්සියේ ප්‍රතිඵල ලැබුණා කියලා හිතෙනවා ලැබුණු ප්‍රතිචාරවලින්."







## පළමු කැමැත්ත නර්තනයට

**• නිපුණි සහ ෂේවියර් කනිෂ්ක මේ මියුසික් වීඩියෝවෙ රඟපෑවා ද නැත්නම් ඒ චරිත තුළ ජීවත් වුණා ද කියලත් අහපු අය හිටියා නේද?**

"ඇත්තටම ඔව්. ගොඩක් දෙනෙක් ඒ දේ කිව්වා. අපි දෙන්නා අතර ඇත්තටම සම්බන්ධයක් තියෙනවා ද කියලාත් ඇහුවා ගොඩක් දෙනෙක්. මොකද ඒ තරමටම තාත්වික රංගනයක් ඉදිරිපත් කළා කියන ප්‍රතිචාර තිබුණේ. ඇත්තටම ඒ ගැන ගොඩක් සතුටුයි. අපි දෙන්නාගේ හොඳ රසායනයක්, ගැළපීමක් තිබුණ නිසා වෙන්න ඇති මේ දේ සාර්ථකව කරගන්න ලැබෙන්න ඇත්තේ. ඉතින් ලැබුණ ප්‍රතිචාරවලින්ම මම හිතනවා ඒ රංගනයට අපි හොඳ සාධාරණයක් ඉෂ්ට කරන්න ඇති කියලා."

**• ඇත්තටම එවැනි අත්දැකීමක් එහෙම නෑනේ නේද?**

"අනේ නැහැ. ඇත්තටම අත්දැකීම් තියෙනවා ද කියන දේ අහපු ගොඩක් දෙනෙක් හිටියා. ඇත්තටම ඒ විදිහට අහපු එක ගැන මට සතුටුයි. මොකද මට එහෙම අත්දැකීම් තියෙනවා ද කියලා අහන්න තරමට මම ඒ චරිත නිරූපණයට සාධාරණයක් කරලා තියෙනවා. රංගන ශිල්පියකුගේ හෝ ශිල්පිනියකගේ සාර්ථක්වය තියෙන්නේ ඒ තැන තමයි. ඇත්තම විදිහට දැනෙන්න රඟපාන්න පුළුවන් කියන්නෙ ලොකු ජයග්‍රහණයක්."

**• අන්සතු ඔබ ගීතයේ වීඩියෝ ක්ලිප්ස් එකතු කරගෙන 'නාඩගම්කාරයෝ' කතාවට සම්බන්ධ කරලා නිර්මාණාත්මක වීඩියෝ නිර්මාණය කරලා තිබුණා නේද?**

"අනේ ඔව්. මමත් ඒවා සමාජ මාධ්‍යවල දැක්කා. හරිම ලස්සනට ගැළපෙන විදිහට ඒ නිර්මාණ කරලා තිබුණා. ඇත්තටම ලංකාවේ මිනිස්සු හරිම නිර්මාණාත්මකයි. ඒවා දැක්කම හිනා යනවා."

**• ඉතින් කලාවට සම්බන්ධ වීම ද නිපුණිගේ අරමුණ වුණේ?**

"මුලින්ම මම කැමැත්තෙන් හිටියේ නර්තන ගුරුවරියක් වෙන්න. පාසලේදීත් නර්තනය තමයි හැදෑරුවේ. පාසල් නර්තන කණ්ඩායමේත් හිටියා. ඒ වගේම නර්තන ශිල්පිනියක් විදිහට පාහින්පත් ඇඳලා තියෙනවා. ඒකනේ නර්තන ශිල්පිනියක් විදිහට ලබන්න පුළුවන් ඉහළම දේ. ඉතින් A/L වලදීත් වැඩිදුර කළේ නර්තනය. ඒ අතරතුර පාසලේ නාට්‍ය කරලා තියෙනවා. රංගන හැකියාවක් මගේ තිබ්ලා තියෙනවා.
නමුත් ඒ තුළින් ඉදිරියට යන්න හිතුවේ නැහැ. සමහරු මේ දක්ෂතා සහජයෙන්ම ගේනවනේ. තවත් සමහරු මේ දේ ඉගෙනගත්තොත් හොඳයි කියලා හිතනවා. ඉතින් මට මේ සම්බන්ධව ඉගෙනගන්න හිතුණා. ඒ නිසාම කැලණිය විශ්වවිද්‍යාලයේ රංගනය පිළිබඳ බාහිර උපාධිය හදාරනවා. ඒ හරහා තමයි මට වේදිකාවට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබෙන්නේ. ඉතින් වේදිකාවට සම්බන්ධ වුණාට පසුව රංගනය පිළිබඳ දැඩි ආසාවක් ඇති වෙනවා.
මොකද ඕනෑම රංගන ශිල්පියෙක්ගේ ශිල්පිනියක්ගේ සාර්ථකම ගමන් මගක ආරම්භය වෙන්නෙ වේදිකාව. ඒ විදිහට ආපු මම 2015 දී වගේ වෙළෙඳ දැන්වීම් කිහිපයකටත් සම්බන්ධ වුණා. 2018 වසරේ 'මිස් වර්ල්ඩ් ශ්‍රී ලංකා' තරගාවලියටත් සම්බන්ධ වුණා. තව නිර්මාණ කිහිපයකුත් කරලා තියෙනවා. නමුත් මාව මිනිස්සු හඳුනාගන්නේ, මාව හොයන්න පටන් ගන්නේ 'අන්සතු ඔබ' මියුසික් වීඩියෝව නිසා තමයි. ඒ හරහා තමයි මට 'නාඩගම්කාරයෝ' වෙනුවෙන් සම්බන්ධ වෙන්නත් අවස්ථාව ලැබෙන්නේ."


**• දැන් කලා ක්ෂේත්‍රයෙන්ම ද ඉදිරි ගමනක් යන්න බලාපොරොත්තුව?**


"දිගටම රැඳෙනවා කියන්නත් බැහැ. නමුත් මම දැන් මේ ක්ෂේත්‍රයට රංගනයට ගොඩක් කැමැතියි. මගේ පවුලෙනුත් හොඳ සහයෝගයක් ලබාදෙනවා මේ ගමන සාර්ථකව ඉදිරියට යන්න. මගේ පවුලේ ඉන්නේ අම්මයි අයියලා දෙන්නයි අක්කලා දෙන්නයි. මම පවුලේ බාලයා. ඉතින් කිසි අඩුපාඩුවක් නැතිව මගේ මේ ගමනට ඒ හැමෝම උදව් කරනවා. අම්මා තමයි මගේ දක්ෂතාවයන් මුලින්ම හඳුනාගෙන මේ ගමනට ලොකුම ශක්තිය වුණේ. අපි හැමෝටම අපේ දක්ෂතා එක්ක ඒවා හඳුනාගෙන තමන්ගේ ගමන යන්න උදව් කළා. ඒ දේ ඇත්තටම ලොකු ශක්තියක්. ඉතින් මගේ ගැන කතාබහ වෙන්නේ, මාව මේ චරිතයට යොමු කරපු ස්වර්ණවාහිනී ආයතනයේ රංගන ද සිල්වා මහත්මයා නිසා. ඒ වගේම ශිවගුරුනාදන් සර්, සද්ධාමංගල සර් ඇතුළු නාඩගම්කාරයෝ කණ්ඩායමේ සියලු දෙනාම ගොඩක් ආදරෙන් මතක් කරන්න ඕනෑ. මට මේ ක්ෂේත්‍රයේ යම් ගමනක් එන්න ඒ කණ්ඩායමේ පිරිස ලොකු සහයෝගයක් මේ වෙද්දී ලබාදෙනවා. මම කොහොමත් නාඩගම්කාරයෝ ප්‍රේක්ෂිකාවක්. ඒ ගැනත් අනිවාර්යයෙන් කියන්න ඕනෑ. ඒ නිර්මාණය මැදදි හෝ මටත් ඒ වෙනුවෙන් රංගනයෙන් දායක වෙන්න ලැබීම සතුටක්. ඉතින් මේ රංගනයත් එක්ක ඉදිරියේදීත් හොඳ ගුණාත්මක නිර්මාණ සහ මට කරන්න පුළුවන් කියලා හිතෙන නිර්මාණවලට මම අනිවාර්යයෙන්ම දායකත්වය ලබාදෙන්න කැමැත්තෙන් ඉන්නවා.
රංගනය වෘත්තිය කරගන්නවා කියන තැනක මම නැහැ. පුළුවන් විදිහට ඒ දේත් කරගෙන ජීවිතේ සාමාන්‍ය සරල නිදහස් විදිහට ගෙවන්න තමයි කැමැති."

**නිපුණි පූජිත ගුණවර්ධන**

**ධනු විජේරත්න**
**සජීව ලක්ෂාන්**
**හැඩගැන්වීම් - නිරෝෂා රණසිංහ**













# විශ්ව සුන්දරියට පෙම් කළ අභිෂේක්

සනී ඩියොල්, අභිෂේක් භච්චන් ළමා වියේදී හොඳම යහලුවෝ වූහ. ඒ සොඳුරු මිතුරුදම තරුණ වියේදීත් නොබිඳී සවිමත් ලෙසට පැවතිණි. එනිසාම සනීගේ පළමුවැනි සිනමා රංගනය බලන්නට අභිෂේක් ද ගියේය.

ඒ 'අර් පයාර් හෝ ගයා' නම් චිත්‍රපටයකය.

රූගත කිරීම් තිබුණේ ස්විට්සර්ලන්තයේය.

දේදුනු බිම වැටුණු කලෙක මෙන් විසිතුරු පියකරු මලින් පිරුණු ඒ දර්ශන තලය අභිෂේක්ගේ හිත මොනවට පැහැර ගත්තේය. සනී ඩියෝල් රඟපෑවේ අයිශ්වර්යා රායි නම් නවක නිළියක සමගය. නළු නිළි යුවළම රිදී තිරයට අලුතින් හඳුන්වා දෙනු ලැබුවද ඔවුන්ගේ රංගනයන් නම් අපූරුය. එහෙත් අභිෂේක්ගේ නෙතද සිතද ගොස් නතර වූයේ අයිශ්වර්යා නම් වූ නිළිය ළඟය.

ඇගේ සිරුරේ ලස්සන බලමින් රසයෙන් ප්‍රමෝදයට පත්වුවත් ඔහුට කටක් ඇර ඇය හා කතා කරන්නට සිතුණේ නැත. එක් හේතුවක් වූයේ ඇය විශ්ව සුන්දරියක වීමය.

''වරෙන් මගෙත් එක්ක රෑ කෑමට''

සනී ඩියෝල් තම ඉපැරැණි මිතුරාට ආරාධනා කළේය. අභිෂේක් දෙවරක් නොසිතාම ඔහු සමග රාත්‍රී කෑම මේසයට ගියේය. පුදුමය මෙන්ම වාසනාවද එතැන තිබිණි. විශ්ව සුන්දරියද සනී ඩියෝල් සමග රෑ කෑමට පැමිණි නිසාය.

''මේ ඉන්නෙ අභිෂේක්. මගෙ පුංචි කාලෙ හිටිය ''හොඳම යාලුවා''. අදටත් ඒ යාලුකම එහෙමමයි.''

සනී ඩියෝල්, අභිෂේක්, අයිශ්වර්යාට හඳුන්වා දුන්නේය.

''එතකොට මේ ඉන්නෙ විශ්ව සුන්දරී අයිශ්වර්යා රායි.''

සනී ඩියෝල්, අභිෂේක්ට කීවේය.

හායි

අභිෂේක් වහා නැගිට අයිශ්වර්යාගේ දෝතම අල්ලා ගත්තේය. තත්පරයක් තරම් පුංචිම පුංචි කාලයකට වුවද ඔහුගේ සිරුරට හිරියක් දැනිණි. විදුලියක් මෙන් සිරුර පුරා ගමන් කරන්නාක් මෙන් නොසන්සුන්කමකින් අභිෂේක්ගේ හිත පිරී ගියේය.

ඔහු බලා සිටියේම අයිශ්වර්යාගේ සිනාව දෙසය. ඕනෑම පිරිමි හිතක් සසල කරන්නට ඒ හිනාවට පුළුවන.

එදා ඔහු ඒ දර්ශන තලයෙන් සමුගෙන ගියේ මිතුරා සනී ඩියෝල්ට අසීමිත ලෙස තුති පුදමිනි.

දෛවය පුදුමාකාරය. මිතුරා මෙන්ම අභිෂේක්ද සිනමා රංගනයට අවතීර්ණ වූයේය. 'දූල් අක්ෂා ප්‍රේම්' ඒ චිත්‍රපටයයි. ඒ 2000 වසරේදීය.

යළි 2003 වසරේදී 'කුචි නා කහා' දර්ශන තලයේදී ඔවුහු එකිනෙකා හමුවූහ. දෙදෙනා එකිනෙකාගේ ගතිගුණ අඩු ලුහුඩු හොඳ නරක යන සියල්ල මැනවින් තේරුම් ගත්තේ 'කුචිනා කහා' රඟපාන කාලයේදීය.



ඇත්තටම ඒ කාලයේදී ඔවුන්ගේ මිත්‍රත්වය මුහුකුරා ගියේය.

ඇයට ඔහු 'අභී' විය.

ඔහුට ඇය 'ආශ්' විය.

ආශ් හා ගෙවන හැම තත්ත්පරයක්ම ඔහුට මහත් ආශ්වාදයක් ගෙන දෙන්නේ මන්දැයි ඔහු කල්පනා කළේය. එහෙත් ඒ බව ඇයට හඟවන්නටවත් ඔහු මැලි විය. ඇය පිළිබඳ සිතේ පිපෙන හැඟීම් සියල්ල හිතේම සඟවාගෙන ඔහු සිටියේය. ආශ් කාට පෙම්කරනවාදැයි ඔහු නොදැන සිටියා සේම, ඔහුගේද පුංචි පුංචි පෙම්කතා නොතිබුණාම නොවේ.

තවත් චිත්‍රපටයකට අභිෂේක්ට ආරාධනා ලැබිණි.

'උම්රෝ ජාන්'

එහිද වාසනාවට මෙන් රඟපාන්නට ලැබුණේ විශ්වසුන්දරී ආශ් සමඟය.

කලකට පසු එකම දර්ශන තලයකදී එකිනෙකා හමු වූ අභී සහ ආශ් එකිනෙකාට සමීප වූයේ අප්‍රමාණ සතුටෙනි.




ආයෙමත් සති කීපයක් අපේ...

දෙදෙනාම දෙදෙනාටම කියා ගත්තේ එකටමය.

ඊළඟට ගුරු, ධූම් 2 යන චිත්‍රපටවලින්ද ඔවුහු හමුවූහ. ඒ අතරින් හොඳම කාලය උදාවූයේ ධූම් 2 දර්ශන තලයේදීය. තම ප්‍රේමණීය හැඟීම් ගැන පුංචි පුංචි ඉඟිකිරීම් කරන්නට අභිෂේක් මැලි නොවිණි. ඒ හැඟීම්, අයිශ්වර්යා පිළිගත්තේද ලෙංගතු හැඟීම් මුදාලමිනි.

ඒ නිවේයෝක් නුවර ගෙවුණු සීතල රාත්‍රියකි. එහෙත් හිම මිදෙන සීතල පරයා හදවතේ උණුසුම ඉස්මතු කළ අපූරු රංගනයක ඔවුහු නියැලී සිටියෝය. එය චිත්‍රපට දර්ශනයක් බව සැබවි. ඒ රාත්‍රියේදී නළුවාට තිබුණේ සිය සාක්කුවෙහි සඟවාගෙන සිටි දියමන්ති මුද්දක් නිළියගේ ඇඟිල්ලක පළඳවන්නටය. දෛවයේ වාසනාවකට මෙන් ඒ නළුවා අභිෂේක් ද ඒ නිළිය අයිශ්වර්යාද වූහ.

ඔහු ඒ සුරත ගත්තේ මහත් ආදරයෙනි. එහෙත් ඔහුට ඒ සුරතේ අසාමාන්‍ය සීතල නොදැනුනා නොවේ. මැණික් කටුවේ පටන් අතැගිලි සියල්ල මුදු සුමුදු ලෙස ස්පර්ශ කළ ඔහු මුදු ඇඟිල්ල අල්ලා ගත්තේය. ඇගේ ඇස් දෙසම බලාගත් ඔහු සාක්කුවේ වූ මුද්ද ගෙන ඇගේ මුදු ඇඟිල්ලට

චන්දි කොඩිකාර

පැළැන්දුවේ බොහෝ පරිස්සමිනි. මුද්දේ දිස්නය ඇගේ දෑස් මොහොතකට නිලංකාර කලෙන් ඇගේ ඇස් විසල් විය. අරුම පුදුම සිදුවීමක් සිදුවන්නාක් මෙන් ඇයට හැඟිණි. එහෙත් ඔහුගේ දෙතොලේ වූයේ දඟකාර මන්දස්මිතයක් පමණි.

'කට්'

අධ්‍යක්ෂවරයා දර්ශනය අවසන් බව කීවේය.

ඔහුගේ මුවෙහි වූයේද ජයග්‍රාහී සිනාවකි.

''හොඳටම ආවා...''

දර්ශනය අවසානයේ අභිෂේක් අධ්‍යක්ෂ වෙත කිට්ටු වූයේ රහසෙනි.

''අර මුද්ද මට දෙන්න බැරිද?''

ඔහු ඇසීය.

''ඒක දියමන්ති මුද්දක් නොවෙයි අභී... ඒකෙ කිසි වටිනාකමක් නෑ''

අධ්‍යක්ෂ කීවේ සරදම් හඬිනි.

''මට වටිනවා. ගොඩාක් වටිනවා. ඒක සඳහටම වගේ මට සිහිවටනයක් වේවි.''

අභිෂේක් කීවේ හැඟීම් බරවය.

දෙන්නම්

ඔහු ඒ මුද්දත් රැගෙන ඔහුගේ කාමරයේ බැල්කනියට වී සිටියේය. ඔහුගේ මතකය පුරා රැඳුණේ කලින් ද රාත්‍රියේ රූගත කළ දර්ශනයයි.

අයිශ්වර්යාගේ මුහුණ ඒ මොහොතේ පුබුදු වූ ආකාරය අභිෂේක්ට මැවී පෙනිණි.

''ඇයි මම ආශ්ව විවාහ කර නොගන්නෙ?''

අභිෂේක් ඔහුගෙන්ම විමසුවේය.

ඔහු වහා මිතුරියට කතා කළේය.

''ආශ් ඔයා කොහෙද ඉන්නෙ?''

''මගේ කාමරේ.''

''මගෙ කාමරේට එන්න බැරිද චුට්ටකට''

''කාමරේට?''

''කාමරේට නොවෙයි... සොරි... කාමරේ ළඟ බැල්කනියට''

''ම්... එන්නම්...''

ඊළඟ මොහොතේ ඇය දිව ආවාය. කොට කලිසමකින් සහ ටී ෂර්ටයකින් සැරසුණු ඇය දිව ආවේ සමනලියක සේය.

''ඇයි හදිස්සියෙ එන්න කිව්වෙ.''

ඇය ඇසුවේ දඟකාර හඬිනි.

''ඊයේ රෑ රඟපාපු දර්ශනය ඇත්තටම රඟපාන්න''

ඔහු කීවේ අර මුද්ද අතට ගනිමිනි.

''ආශ්... අපි දෙන්න මැරි කරමු වස්තුවෙ...''

අභිෂේක් කීවේ මුද්ද සිය ඇඟිලි තුඩුවලින් රවුම් කරමිනි.

ඇය ඔහු දෙස බැලුවේ පුදුමයෙනි.

''විහිළුවක් නෙවෙයි...''

ඇය තම තුරුලට ගත් ඔහු ඇගේ කම්මුල් අතොරක් නැතුව සිප ගත්තේය. ඕනෑතරම් චිත්‍රපට දර්ශනවල ඔවුහු සිපගෙන තිබුණත් මේ සිප ගැනීම ඒ සියල්ලට වඩා වෙනස්ය.

අන්තිමේදී ඇය ඔහුගෙන් ගැලවුණාය.


''හා''

ඇය කීවේ දෙවරක් නොසිතාමය.

අභිෂේක් බච්චන් අයිශ්වරයා රායි ඇත්තෙන්ම ඔවුන්ගේ විවාහයද චිත්‍රපට දර්ශනයක් මෙන්ම විචිත්‍ර විය. වහාම මුම්බායි නගරයට පැමිණි ඔවුන් දෙදෙනා තම විවාහ ගිවිස ගැනීම සිදු කළෝය. ඒ 2007 ජනවාරි 14 වැනිදාය.

අභී ආශ් පෙම් පුවත ගැන ඔවුන් මාධ්‍යයට හෙළි කළේ අනතුරුවය. එකට ගමන් බිමන් යන්නට පටන් ගත්තේ අනතුරුවය.

කෙසේ වෙතත් මේ අපූරු පෙම් කතාව මාධ්‍යවලට තලු මරන්නට සුදුසු අපූරු ප්‍රවෘත්තියක් විය. මොහොතකින් භාරතයම නොව ලෝකයම මේ පෙම් පුවත ගැන කතා කරන්නට පටන් ගත්හ. සිනමා සඟරාවල කවර සරසන්නට මොවුනට සිදුවිය.



## "අපි ඇත්තටම විවාහ වෙමුද?"

කොටින්ම කියතොත් මෙය සුරංගනා කතා ගොඩට එකතු වූ අලුත්ම සුරංගනා කතාව බවට පත්විය.

ඉන් තෙමසකට පසු එනම් අප්‍රේල් 20 වැනිදා බච්චන් නිවහන සුරංගනා ලෝකයක් මෙන් විචිත්‍රවත්ව සැරසුණේ අභී-ආශ් විවාහය වෙනුවෙනි. සිනමා තාරකා, දේශපාලකයන්, ව්‍යාපාරිකයන් වැනි සුපිරි ආරාධිතයන්ගෙන් පිරුණු විවාහ මංගලෝත්සවය දින කිහිපයක් පුරාවට පැවැත්විණි.

සියල්ල අවසානයේ ඔවුන් ගියේ තිරුපති දෙවොලටය. ආශිර්වාද පූජාව වෙනුවෙන් අභිෂේක් සමග අමිතාබ් බච්චන්ද සහභාගී විය.

ඉනික්බිති ඔවුහු සතුටින් ජීවත් වූහ යනුවෙන් මේ සුරංගනා කතාව නිමා කළ නොහැකිය. ඇත්තටම ඔවුන්ගේ දියණිය ආරාධ්‍යාද ඔවුන් අතරට ආවේ පුංචි සුරංගනාවක් ලෙසිනි.

මේ වනවිට ඔවුන්ගේ යුග දිවියට වසර 14ක් අවසන්ය. මේ වසරේ සැමරෙන්නේ එහි පහළොස් වැනි සැමරුමයි.

බොහෝ තාරකා විවාහයන්හි දීප්තිය පවතින්නේ ටික කාලයකි. උන් හිටි ගමන් ඒ තරු කඩා වැටේ. එහෙත් අභී ආශ් එසේ නොවේ. ඔවුහු අදටත් ප්‍රේමයෙන් ජීවත් වෙති.



# සුභාවිත ගී මග සරසන මිස්කින්

**මුදු දිය දහරකි ඔබේ වදන්**
**පිරිමදිනා සිත කය පුබුදු**
**ඈත මෑත සිට මා අමතන්නී...**

**අසෙනිය කුසුමකි මට වදුදුන්**
**ලෙන්ගතුකම් දුක අස්වසනා**
**කටුක වටපිටාවේ ගිනි මුදනා**
**වැහිපතනය සේ ඔබ පැමිණේ**

## රස්සාවෙන් ඉංජිනේරුවෙක් වුනත් වැඩි කැමැත්ත ගායනයට

මහාචාර්ය ප්‍රණීත් අබේසුන්දර ලියා රංජිත් ප්‍රේමවීර ගේ සංගීත නිර්මාණයෙන් ඉමිහිරි වූ මේ ගීතය ගයන්නේ රියස් මිස්කින් නමැති ගායන ශිල්පියෙකි.

වත්මන ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර වෙසෙන ඔහු වෘත්තියෙන් යාන්ත්‍රික ඉංජිනේරුවෙකි.

එහෙත් ඔහුගේ හදවත සංගීතයට ඇලී බැඳී තිබේ. ඒ ලංකාවේ වෙසෙන සමයේ සිටමය. මහරගම උපන් ඔහු බොරැල්ලේ වෙස්ලි විදුහලෙන් අධ්‍යාපනය ලැබුවේය. ඔහුගේ සංගීත ඇල්ම වැඩිවූයේත් දැනුම වර්ධනය වූයේත් පාසලේදීමය. ඔහු එකල පාසල් තූර්ය වාදක කණ්ඩායමේ එකෝඩියන් වාදකයා වූයේය.

එසේම විද්‍යාලයේ කලා කටයුතු වලදී මුල්තැන ගත් ඔහු සාහිත්‍ය සංගම් වේදිකාවේදී මෙන්ම විවිධ ප්‍රසංග වලදීද ගීත ගායනා කළේය. ඔහුගේ ගී හඬ සිත නිවද්දී පාසලේ දඟකාර කොල්ලන් වුවද මීක් හඬක් නැතුව මිස්කින්ගේ ගී හඬට වසඟව සිටියේය.

ගුණදාස කපුගේ, සෝමතිලක ජයමහ වැනි ගායන ශිල්පීන්ගේ ගී ගැයූ ඔහු ඒ ගීත වලට නව පණක් දෙන්නට සමත්වූයේය.

මිස්කින් ඊළඟට මොරටුව සරසවියට ඇතුළත් විය. හැදෑරුවේ යාන්ත්‍රික පාඨමාලාවක් වුවද කලා සංගමයේ සඟරා සංස්කාරක වූයේ ඔහුය. පාරිසරිකයෝ, විමංසා වැනි විවිධ විෂයක සඟරා පළකරන්නට ඔහු ප්‍රමුඛ සංස්කාරක මඬුල්ල සමත්වූහ. මිස්කින් ඒ කාලයේද සංගීතය සහ ගායනය අමතක කළේ නැත. මොරටු සරසවියේ ඉංජිනේරු පීඨය ස්වරමධු නමින් කලා උළෙලක් සංවිධානය කරද්දී, මිස්කින් ද එහි ගායකයකු විය.

''මුලින්ම මම ගායනයට යොමුවුණේ අවුරුදු 15 දී. මගේ තාත්තාත් ලස්සනට සිංදු කිව්ව කෙනෙක්. තාල භාණ්ඩ වාදනයට වගේම හින්දි ගීත කියන්නත් තාත්තා බොහෝම දක්ෂයෙක් වුණා. ඔය ආභාෂය නිසා තමයි මමත් ගී ගයන්න පුරුදු වුණේ. මං ඒ කාලේ නිතරම ගයන්නේ මනමාල ගිරවී.. ගීතය.''

මිස්කින් ඔහුගේ අතීත මතකයේ කිමිදෙන්නේය.

''ඉන් පස්සෙ මම විශාරද එඩ්වඩ් ජයකොඩිගෙන් ගායනයත් බටනලාව සහ වයලීනය සරත් ජයරත්නගෙනුත් තාල භාණ්ඩ වාදනය විජේරත්න රණතුංගගෙන් ඉගෙන ගත්තා. මම මගේම ගීතයක් ගායනා කළේ මේ විදිහට හැදෑරීමකින් පස්සෙ.''

මිස්කින්ගේ පළමු ගීතය ජනගත වූයේ 2018 වසරේදීය. නාලක අංජන කුමාරගේ සංගීතයට එහි පද ලියා ගත්තේ ඔහුමය. ඉනික්බිති තව තවත් ගී ගැයූ ඔහු මේ වනවිට ගීත 11 ක් ජනගත කර තිබේ.

මේ දිනවල තවත් ගීත හයක වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතී. රඹුකන සිද්ධාර්ථ හිමි, මහින්ද චන්ද්‍රසේකර, සුනිල් ආර්. ගමගේ, වසන්ත කුමාර කොබවක, මහාචාර්ය ප්‍රණීත් අබේසුන්දර, රත්න ශ්‍රී විජේසිංහ, කුලරත්න ආරියවංශ වැනි ගී පද රචකයන් මිස්කින්ට ගී ලියා තිබේ.



# විනෝද සමය ඉවරයි



සැමරුම්

තම දරුවා පාසලට බාරදෙනු පිණිස පියෙක් විදුහල්පති හමුවීමට ගියේය. ඒ ගියේ සිය පුතාද සමගය. පියා සරමකින් සහ කමිසයකින් සැරසී සිටි අතර පුතා සිටියේ බාච්චු කොට කලිසමකින් සහ කමිසයකින් සැරසී වතුර බෝතලයක් කරේ එල්ලාගෙනය. පොතක් සහ පැන්සලක් අතක විය.

'හොඳයි. අපි එහෙනම් මේ ඉල්ලුම් පත්‍රය පුරවගෙන ඉමු.'

විදුහල්පති කීවේ පිය පුතු දෙදෙනාම දෙස බලමිනි.

'පියාගේ නම?'

'පියසේන.'

උත්තර දුන්නේ දරුවාය.

'හොඳයි. එතකොට දැන් කියන්න ඔය ළමයගෙ නම?'

විදුහල්පති කීවේ දරුවා දෙස බලාය.

'මගෙ නම... ලියාගන්න... පියසේන.'

'පියසේන... හොඳයි එතකොට මේ දෙන්නගෙම නම එකයිද?'

විදුහල්පති ඇසුවේය.

'නෑ දෙකක්.'

දරුවා කීවේය.

'දෙකක් නම් පියාගේ නම ඇහුවාම පියසේන කිව්වෙ.'

විදුහල්පතිට යකා නැග්ගේය.

'ඔව්... පියාගේ නම පියසේන තමා.'

'එහෙනම් දැන් දෙකක් කිව්වේ?'

'ඒ මගෙයි මෙයාගෙයි.'

දරුවා කීවේ සිය තාත්තාව පෙන්වමිනි.

'හොඳයි ආයෙ කියමු බලන්න. ඔය ළමයගෙ නම?'

විදුහල්පති ඉල්ලුම් පත්‍රය මුල සිටම පුරවන්නට විය.

'පියසේන.'

'හරි... ඊළඟට කියන්න පියාගේ නම?'

'පියසේන...'

ඒ පාර ආයෙ කියනවා පියාගේ නම පියසේන කියලා. හොඳයි කවුද දැන් පියා.'

'මම'

දරුවා වහා ඉදිරියට ආවේය.

'මට හැමෝම කියන්නෙ පියා කියලා.'

ඇනස්ලි ඩයස්, බර්ටි ගුණතිලක, සැමුවෙල් රුද්‍රිගු තුන් දෙනාගේ 'විනෝද සමයේ' දුටු එක් සිද්ධියක් එසේ මගේ මතකයේ අලුත් වූයේ බර්ටි ගුණතිලක මෙලොවින් සමුගෙන ගිය බව ඇසුණු මොහොතේමය.

ගුවන් විදුලියේ ප්‍රචාරය වූ 'විනෝද සමය' යනු එකල අපි ආශාවෙන් සවන් දුන් වැඩසටහනකි. කටපුරා සිනාසෙන්නට ඉඩකඩ සැලසූ විනෝද සමයේ අප වඩාත් ප්‍රිය කළේ බබාගේ චරිතය නිරූපණය කළ බර්ටි ගුණතිලකටය.

මුලින් හඬ පමණක් ඇසුණ ඇනස්ලි, බර්ටි, සැමුවෙල් තුන් දෙනා රූපවාහිනියේ පැමිණීමත් සමග අපට දකින්නට හැකිවිය. සුප්පුවක් කටේ ගහගෙන සිටි පොඩි එකා හෙවත් බර්ටි දුටු විට සිනා නැගුණේ නිරායාසයෙන්මය.

වරක් ගුටි කෙළියකට මුහුණ දුන් බර්ටි ගුටි කෑ ආකාරය විනෝද සමයේදී අමාරිස් අයියාට පැවසුවේ 'ඌ මට ගැහුවා මට ඌ ගැහුවා' යනුවෙනි.

'එතකොට මමමනේ ගුටිකාලා තියෙන්නේ' අමාරිස් අයියා කී විට අන්තිමේදී බර්ටි ම තේරුම් ගත්තේය.

මෙබඳු කතා මහ ගොඩක් විනෝද සමයෙන් අපේ කනට වැටිණි. ආප්ප වාටියට අත කැපී මියගිය පුද්ගලයන් ගැන අපට මුලින්ම ඇසුණේද විනෝද සමයෙන්මය.

මේ නිසා එකල මාසික රැඟුම යද්දීත් අප බලා සිටියේ විනෝද සමය ගෙන සැමුවෙල්, බර්ටි, ඇනස්ලි එනතුරුය.



ඇනස්ලි, බර්ටි සහ සැමුවෙල්

තවත් සිද්ධියක් මගේ මතකයට එයි. එකල බොහෝ ප්‍රසංග වේදිකාවලද අතරතුරේ විනෝද සමය රඟදැක්විණි. දුර බැහැර සංදර්ශනයකට යන්නට ඔවුන් තුන් දෙනා කුලී කාරයක් 'හයර්' කර ගත්තේය.

'අපි අපේ නාට්‍යය පුරුදු වෙමුද?'

ටික දුරක් යද්දී එක්කෙනෙක් යෝජනා කළේය.

'ඒක හොඳයි අපි එහෙම කරමු' කී අනෙක් දෙදෙනා ඔවුන්ගේ එදට නියමිත ජවනිකාව පුරුදු වන්නට වූහ. එය රණ්ඩුවකි. මේ රණ්ඩුවේ කෙළවර, එකෙක් තවකෙකුගේ ගෙල මිරිකීමය. පසුව අනෙකා මහ හඬින් කෑ ගසන්නේ සගයා බේරා ගන්නටය.

රණ්ඩුව දුර දිග යනවිට කුලී රියේ රියදුරා බියට පත්විය. ඔහු සිතුවේ කාරයට නැගුණු තුන්දෙනා ඇත්තටම රණ්ඩු වන බවය.

ඔහු කුලී රිය අසල තිබූ පොලිසියකට අල්ලා කාරය නතර කර පොලිසියට දිවගොස් කාරයට නැගුණු තුන්දෙනා මිනී මරාගන්නා බව පැවසුවේය. පොලිසියේ අය පැමිණ රියට එබෙන විටත් තුන් දෙනාගේ රණ්ඩුව එහෙමමය.

පොලිසියේ අය කළේ තුන් දෙනාවම ස්ථානාධිපති වෙත කැඳවාගෙන යෑමය.

'අපි සැමුවෙල්, බර්ටි, ඇනස්ලි තුන්දෙනා. අපි මේ ෂෝ එකකට යන ගමන්. අපි ඒ නාට්‍යයි පුහුණු වුණේ.'

ඔවුහු උත්තර දුන්හ.

එද ඔවුනට ඒ ජවනිකාව යළි පොලිසියේද රඟ දක්වන්නට සිදුවිය.

මෙබඳු කතා ඕනෑ තරම් තිබේ. ඒ හැම කතාවක්ම විනෝද සමය සේම හිනායන සුළුය.

මේ තුන් කට්ටුවේ සැමුවෙල් සහ ඇනස්ලි නික්ම ගොස් සෑහෙන කාලයකි. බර්ටි ගොඩකවෙල සිය දියණියගේ නිවෙසක සතුටින් ජීවත් වූයේය. ඔහුගේ උපන් දිනවලට පුංචි සැමරුම් පිංකම් ආදියද කෙරුණ බව අපට ආරංචි වූයේය. විටින් විට ඔහුගේ සම්මුඛ සාකච්ඡාද අපි පළ කළෙමු. ඒ හැම විටෙකම අපි ඔහුට දීඝායු පැතීමු.

එහෙත් ගෙවීගිය සතියේ දවසක ඔහුගේ විහිලු කතා සියල්ල නිමා වූයේය. ඒ සිනාවේ කෙළවර ඇත්තේ කඳුළ බව අපට පසක් කර දෙමිනි.

එහෙත් බර්ටි ගුණතිලක කී විට අපේ දෙතොලට එන්නේ සිනාවක් මිස දෙනෙතට කඳුළක් නොවේ. හේතුව ඔහු අපට කියා දුන්නේ සිනාසෙන්නටය.

ශකුවි



# ගමන් මග

මන්නාරම ජේසාලේ හරහා තලෙමන්නාරම දෙසට යද්දී හමුවන පල්ලිමුනෙයි

**එවක ලෝකය කාන්තාරයක් වැනිය. සතුන් මිස එකදු ගහක්වත් පොළොව මත නොතිබිණ. දෙව්ලොව සිට පොළොව දෙස බැලූවිට මැවුම්කාර දෙවියන්ට පාළුවක් දැනිණි.**

'පොළොවේ ගස් හිටවන්න ඕනෑ. එතකොට පොළොව ලස්සන වෙයි. ගස්වල නිල්ල. මල්වල පාට සුවඳ එකතු වුණාම.'

තමන්ටම කියාගත් දෙවියෝ පොළොවෙහි විසූ සියලු සතුන් කැඳවූහ.

'මේ ගස් ගෙනිහින් පොළවේ හිටවපල්ලා.'

දෙවියන් වහන්සේ කැලේ සතුන් අමතා පැවසූහ.

පෝලිමේ ආ සතුන් සියල්ලන්ටම එක් එක් වර්ගයේ ගස් ලබාදුන් දෙවියන් වහන්සේ ඒ ගස්වලින් පොළොව ලස්සන වන හැටි සිතින් දකිමින් සතුටු වූහ.

සත්තු තම තමන්ට ලැබුණ ගස් ගෙනගොස් සිටුවා වතුර දමා පොහොර දමා පරෙස්සම් කරගත්හ.

හයිනාවාට ලැබුණු ගස ගෙන ගොස් පොළවේ සරු තැනක් බලා වළක් කපා හිටෙව්වේය.

හැබැයි ඌ ඒ ගස සිටෙව්වේ මුල් උඩට එන්නටය.

දෙවියන් තිළිණ කළ නිසාදෝ ඒ උඩුකුරුඇඳ්ඇඳං ගසද නොමැරී වර්ධනය විය.

හයිනා මේ ගස සිටෙව්වේ අද අප්‍රිකාව ලෙස හඳුන්වන භූමියෙහිය.

දේශගවේෂක ලිවින්ස්ටන් අප්‍රිකා භූමියේ සංචාරය කරද්දී හයිනා සිටවූ උඩුකුරුඇඳ්ඇඳං ගස දුටුවේය.

ලොව තිබෙන විරූපීම ගස ලෙස ඔහු එම විකාර රූපී ගසට සහතිකයක් දුන්නේය.

එහෙත් අප්‍රිකාවේ වෙසෙන බන්ටු ගෝත්‍රිකයන් මේ ගසට දුන්නේ බහු-බැබ් යන නමය. එබැවින්



## දකුණු ආසියාවේ ලොකුම ගස

ලොව පුරා මේ ගස පතල වූයේ බයෝබැබ් යන නමිනි.

මේ ගස වෙනස්ම හැඩයකි. උසට වඩා මහත බැවින් ලොව අනෙක් ගස් සමග සසඳද්දී විකාරයක් සේ පෙනේ. මෙහි අරුමය මීටර් පහළොවක විස්සක තරම් පරිධියක් සහිත යෝධ කඳක් පිහිටීමය. එහෙත් උස මීටර් හත අටකට වැඩිවන්නේ කලාතුරකිනි. ගසේ අතුපතර මීටර් හැටක් තරම් දුරකට විහිදෙන බැවින් කාන්තාරයකට සරතැස නිවන අපූරු සෙවනක් සැලසේ.

එහෙත් මේ ගසට සෙවන සැලසිය හැක්කේ වසරේ මාස තුනක් තරම් කෙටි කලකට පමණි. අනෙක් මුළු කාලයම මේ ගස සිටින්නේ කොළ හලාගෙනය. දේශගවේෂක ලිවින්ස්ටන් අප්‍රිකාවට ගියේ බයෝබැබ් ගස කොළ හලාගෙන සිටි කාල වකවානුවකය. ඔහුට මේ ගස ලොව ඇති විරූපීම ගස ලෙස පෙනුනේ එබැවිනි. ඒ විතරක් නොවේ. මේ ගස උඩුකුරුඇඳ්ඇඳං වී ඇතැයි පෙනෙන්නේද ඒ කාලයටය.

බයෝබැබ් ගස සඳට පෙම් කරයි. එනිසාදෝ එහි මල් පිපෙන්නේ රාත්‍රියේදීය. එහි කැකුල ගෝලාකාර හැඩයක් ගනී. එහෙත් ගෝලය මලක් සේ පෙති ඇරෙන්නට පැයකට වඩා වැඩි කාලයක් ගෙවෙන්නේ නැත. පිපෙන මල අඟල් හයක් තරම් වේ. හමන පවනට දෙන්නේ ඉම්හිරි සුවඳකි. එහෙත් ඒ සුවඳ මීමැස්සන්ට සමනලයන්ට තහනම්ය. හේතුව හිරු නැගී මී මැසි සමූහයා රොන් සොයන්නට පටන් ගනිද්දී මල පරවන නිසාය. මේ නිසාම බයෝබැබ් මලට පෙම් කරන්නේ වවුලන් සහ රාත්‍රී කල හැසිරෙන සලබයන් වැනි කෘමීන්ය.

පිපෙන මොහොතේ සුවඳ විහිදන බයෝබැබ් මල පරව යද්දී සුළඟට මුසුකරන්නේ දුඟදකි.

කෙසේ වෙතත් සැප්තැම්බරයේ දී මල් පුබුදුවන දෙසැම්බරයේදී ගෙඩි තිළිණ කරයි. මේ ගෙඩියක ඇට තිහක් තිබේ.

ඒ කාලයට මේ ශාකයට තනියක් නැත. වඳුරෝ ගසට අරක් ගනිති. උන්ට මෙහි ගෙඩි දෙල් ගෙඩි වැන්න. එනිසාම වඳුරු දෙල් යන අපර නමක්ද බයෝබැව් ගසට පටබැඳී තිබේ. වඳුරන් ගහ උඩ සිට ගෙඩි කද්දී අලි ඇත්තු ගස යට සිට හොඬවැලෙන් ගෙඩි කඩාගෙන කති. ඇඹුලට හුරු පැණිවලින් පිරුණු මේ ගෙඩි මිනිසාද නෙලාගෙන ඉන් රසවත් බීමක් හදගනී.


අප්‍රිකාවේ බන්ටු ගෝත්‍රිකයන් නම් මේ ගසෙන් තවත් ප්‍රයෝජන ගත්තේය. ගසේ පොත්තෙන් ඔවුහු කඹ ඇඹරූහ. මේ කඹ මොනතරම් ශක්තිමත් ද යත් ඒවායින් බැඳ දැමුවේ යෝධ අලි ඇතුන්ය. බයෝබැබ් කඹය කඩන්නට යෝධ ශක්තියක් ඇති අලින්ටවත් නුපුළුවන.

බයෝබැබ් ගසේ තවත් සුවිශේෂී ප්‍රයෝජනයක් වේ. එය නම් ජල ටැංකියක් සේ භාවිත කිරීමට හැකි වීමය. අප්‍රිකාවට වැසි වැටෙන සමයට බයෝබැබ් ගසේ කඳ තුළ වතුර ලීටර් දහස්



බයෝබැබ් ගස

# මන්නාරමේදී ඇස ගැටෙන 'කාන්තාරයේ වතුර ටැංකිය'






කොළ හැලුණු සමය









ගණනක් රැස්කර තබාගත හැකිය.

සමහරු මේ කඳ තුළ ගෙවල්ද තනාගනිති. වනසතුන්ගෙන් ආරක්ෂාවද ලබාගෙන මේ ගසේ කඳ තුළ වාසය කළ හැකිය. ඒ කෙසේ දැයි ඔබ මවිත වනු ඇත. හේතුව එහි කඳේ ස්වාභාවය ගැන තවමත් කිසිවක් සඳහන් නොකිරීමය.

බයෝබැබ් ගසේ දැවැන්ත පරිධියක් තිබුණත් ඒ කඳ පුරාම අරටුවක් නොමැත. මේ කඳේ අභ්‍යන්තරය හිස්ය. ඒ හිස් අවකාශය තුළ මිනිසුන් ගණනාවකට පහසුවෙන් හිටගෙන සිටිය හැකිය. වඩාත් පැරණි වූ ගසක නම් මේ අවකාශයේ

**රෑට පිපෙන මල් උදේට පරවෙයි පිපෙද්දි සුවඳයි පරවෙද්දි ගඳයි**

තරමක කාමරයක ඉඩකඩට සමාන වේ.

බයෝබැබ් ගිනි තැබිය නොහැකිය. ගංවතුරට ගලවාගෙන යා නොහැකිය. සුළි සුළඟකට පෙරලා දැමීමටද නුපුළුවන. එනිසාම බයෝබැබ් ගස් අවුරුදු පන්දහසක් තරම් කල් ජීවිතය රැකගන්නට සමත් වෙයි.

ලංකාවේ බෝධි වෘක්ෂය, කැලිෆෝනියාවේ රෙඩ්වුඩ් මෙන්ම ලෙබනනයේ සීඩර් ලොව ඉපැරැණිම ශාක විශේෂය. බයෝබැබ් අයත් වන්නේද ඒ ගොඩටය.

බයෝබැබ් විශේෂ අටකි. ඉන් හයක්ම මැඩගස්කරයට ආවේනිකය. එකක් වයඹ දිග ඕස්ට්‍රේලියාවේ හැදෙයි. අනෙක අප්‍රිකාවේය. මේ නිසා බයෝබැබ් නිජබිම මැඩගස්කරය ලෙස සැලකේ. නමුත් ලොව වැඩිම බයෝබැබ් ගස් ගණනක් ඇත්තේ අප්‍රිකාවේ තෘණගා වන උයනේය.

මෙය විශ්මිත ගසකි. එනිසාම එය අප ද දැකබලා ගත යුතුය. වාසනාවකට මෙන් ඒ සඳහා මැඩගස්කරයට හෝ අප්‍රිකාවට හෝ යන්නට අපට අවශ්‍ය වන්නේ නැත. මන්නාරම පේසාලේ හරහා තලේමන්නාරම තෙක් වැටුණ A-14 පාර දිගේ පල්ලිමුනෙයි වෙත යාම පමණක් ප්‍රමාණවත්ය. අවුරුදු අටසීයක් පැරැණි බයෝබැබ් තරුණයෙක් පල්ලිමුනෙයි හි ජීවත්වන බැවිනි.

පෘතුගීසි ලන්දේසි පාලන කාලවලදී ලංකාවට ගෙනා අශ්වයන් සමග මේ බයෝබැබ් ගස ද ගෙනා බව කියැවේ. ඔවුන් ඩෙල්ෆ්ට් දූපත අශ්වයන් බෝ කරන්නටම වෙන්කර තිබිණි. මේ අසුන්ට වැළඳෙන පොදු අසනීපයකට හොඳම ප්‍රතිකාරය වන්නේ බයෝබැබ් කොළවලින් සාදන ඖෂධයකි. එනිසා අසුන් සමගම බයෝබැබ් ගස්ද ලංකාවට ගෙනෙන්නට ඇත. මන්නාරම, පුත්තලම, යාපනය වැනි ශුෂ්ක කලාපයට අයත් ප්‍රදේශවල බයෝබැබ් ගස් සිටුවා තිබේ. හැබැයි ඔවුන්ද මේ ගස් සිටුවා ඇත්තේ හයිනාවා සිටවූ පරිදිම උඩුකුරුඇඳ්ඇඳංවය. ඒ බව තේරෙන්නේ ගිම්හානයේදී කොළ හැලී ඉපල් බේරුණු විටය.

කෙසේ වෙතත් එකල තිබූ තරම් බයෝබැබ් ගස් අද ලංකාවේ දකින්නට නැත. අදටත් ඩෙල්ෆ්ට් දූපතේ ගස ඉතිරිව ඇත. විල්පත්තුවේ ගස් කිහිපයක් තිබේ. පුත්තලම නගර මධ්‍යයේ දැවැන්ත ගසක් තිබූ බව ඉපැරැණි සටහන්වලින් හමුවේ.

කෙසේ වෙතත් අද බයෝබැබ් ගසක් දැක බලාගත හැකි පහසුම තැන මන්නාරම් දූපතේ පල්ලිමුනෙයි බව කිව යුතුමය.

මේ ගස මීටර් 7.5 ක් උසය. වට ප්‍රමාණය මීටර් 19.5 කි. දකුණු ආසියාවේ ඇති විශාලම ගස වන්නේද පල්ලිමුනෙයි බයෝබැබ් ය.

දෙමළ මිනිසුන් මේ විකාරරූපී ගසට කීවේ පප්පරප්පිලි සහ පෙරියොකෝවරම් කියාය. පප්පරප්පිලි යන්නෙහි තේරුම යෝධයාගේ සියඹලා යන්නයි. ගස යෝධයකු මෙන් පෙනීමත් ගෙඩිවල ඇඹුල් රසයක් තිබීමත් මේ නමට හේතුපාදක වන්නට ඇත. පෙරියෝකෝවරම් යන්නෙහි සිංහල තේරුම විශාල ගස යන්නය.

ලංකාවේ බයෝබැබ් ඉතිහාසය සොයා යෑමද සුන්දර අත්දැකීමකි. ඒ ගමන නතර විය යුත්තේ පුත්තලමේය. වාර්තා වී ඇත පරිදි ලංකාවේ ලොකුම බයෝබැබ් ගස එයයි. එම ගසේ වට ප්‍රමාණය අඩි 45කි. ගසේ උඩ අඩි 8 දී පමණ කඳ දෙකට බෙදී තිබීම ඒ ගසේ විශේෂත්වය විය. එහෙත් එම ගස අද පුත්තලමේ දකින්නට නැත.

ශාන්ත කුමාර විතාන
අන්තර්ජාලය

# නෙරුදාට 'ලව්' කරන පැට්සි



**අසෝක හඳගමගේ ප්‍රවීණයාගේ අධ්‍යක්ෂණයෙන්, එච්. ඩී. ප්‍රේමසිරිගේ නිෂ්පාදනයෙන් නිර්මාණය වූ, ඇල්බොරාදා චිත්‍රපටයේ විදේශීය නළු නිළියන් කීප දෙනකුගේ රංගනයන් අපට දැකගත හැකිය. මෙහි පැට්සි (Patsy) යන චරිතය නිරූපණය කරන එනම් පැබ්ලෝ නෙරූදාට, ඔහුගේ කවියට පෙම්බැඳි ඇය ගැන නොදන්නා බොහෝ දෙනා සිතන්නේ ඇය ද විදේශීය රංග ශිල්පිණියක යනුවෙනි. ඇයගේ බාහිර පෙනුම නිසා එසේ පෙනුන ද ඇය ශ්‍රී ලාංකීය ශිල්පිනියකි. මෙරට ඉංග්‍රීසි වේදිකාවට නම් ඇය අමුත්තියක නොවේ. ඇය නමින්, නිමායා හැරිස්ය. නිමායා, මේ මොහොතේ වෙසෙන්නේ හොංකොං රාජ්‍යයේය. එහි සිට ඇය අප සමග කතා බහකට එක්වූයේ මෙලෙසිනි.**

**• 'නිමායා' ලංකාවේ මොන පළාතෙද කියලා දැන ගන්න කැමැතියි?**
කොළඹ.

**• අම්මා-තාත්තා ගැන එහෙම සහ පවුලෙ විස්තර කියමු?**
මගේ අම්මා ශ්‍රී ලාංකික කාන්තාවක්. තාත්තා එංගලන්ත ජාතිකයෙක්. මම හැදී වැඩුණෙ ලංකාවේ. පාසල් අධ්‍යාපනය ලැබුවෙත් මෙහිදීමයි. මම ගියේ කොළඹ කාන්තා විද්‍යාලයට. මට එක් සහෝදරියක් ඉන්නවා.

**• නිමායා, තවමත් උසස් අධ්‍යාපනය ලබන කෙනෙක්. ඒ ගැන කොහොමද විස්තර කරන්න පුළුවන්?**
ඔව් මම තවම යුනිවර්සිටි අධ්‍යාපනය හදරන්නෙ. ඉංග්‍රීසි සාහිත්‍ය සහ දේශපාලන විෂයයන් හදරනවා.

**• අනාගතයේ දී ක්‍රියාකාරී දේශපාලනයට එමේ අරමුණක් තියෙනව ද?**
මට ඕනෑ කරන්නෙ ගුරු වෘත්තිය තෝරා ගන්නයි. මම ආසයි මගේ අම්මා වගේ අධ්‍යාපනයෙන් ඉහළට ගිය චරිතයක් වෙන්න. ඊට අමතරව වේදිකා සහ රංගන විෂයයට සමීප වී කටයුතු කරන්න පටන් ගත්තෙ කුඩා කාලයේ ඉඳලමයි. අනාගතයේ දී වෘත්තීය මට්ටමේ රංග ශිල්පිනියක් වීමට නම් මුල සිට හොඳ අඩිතාලමක් හැදෑරීමක් තිබීම හොඳ දෙයක්. ඒ නිසා මෙතෙක් ආ ගමන මට හරි වැදගත් වුණා. අධ්‍යාපනික වශයෙන් ඉදිරියට යන අතරේ රංගන කලාව සමග සමගාමී ජීවිතයක් ගත කිරීමට මම ආසයි. ඒ දිනවල අම්මා රංග හා නාට්‍ය ගුරුවරියක ලෙස ළමයින්ට ඉගැන්වීම් කරද්දී මටත් මඟ පෙන්වීමක් ලැබුණා. කොහොමටත් අම්මත් වේදිකා නාට්‍ය අංශයේ රඟපෑ නිර්මාණකරණයට දයක වූ කෙනෙක්. ඒ විදියට ආ ගමනේ දී ජෙරොම් ද සිල්වා යටතේ මම සංගීතමය නිර්මාණවලට දයක වුණා. වයස අවුරුදු පහේ සිට වගේ මම විටින් විට ඒ විදියට තියටර් එක එක්ක සමීපව කටයුතු කරමින් සිටිනවා. වයස අවුරුදු 7දී විතර සංගීතමය නිර්මාණයකට දයක වුණා. ජෙරොම් ද සිල්වා කළ සවුන්ඩ් ඔෆ් මියුසික් නිර්මාණයෙත් රඟපෑවා. මේ විදියට මෙරට ඉංග්‍රීසි වේදිකාවේ නිර්මාණවලට එද ඉඳලම දයක වෙමින් සිටිනවා.

**• කොහොම ද 'හොං කොං' සිට ගෙවන ජීවිතය ? හුදෙකලාවක් දැනෙන්නෙ නැද්ද?**
අධ්‍යාපන කටයුතු එක්ක සතුටින් ගත කරන බව කියන්න පුළුවනි. ශ්‍රී ලාංකික මිතුරන් වගේම මගේ අම්මගෙ ශ්‍රී ලාංකීය හිතවත් පවුල්වල අය සිටිනවා. සමහර වෙලාවකට හුදෙකලාවත් නොදැනෙනවාම නෙවෙයි. තවම මම තරුණයිනෙ. ඉතින් ජීවිතය සතුටින් ගතවනවා කියලා කියන්න පුළුවන්.

**• ඇයි, උසස් අධ්‍යාපනයට 'හොං කොං' හි සරසවියක් තෝරා ගත්තෙ ?**
එකක් මම ආසියාවට ආසයි. ගුවන් කාලය දිහා බැලුවාම එක ෆ්ලයිට් එකකින් එන්න පුළුවන්. මුලින්ම හොං කොං එනකොට නම් හොං කොං ගැන එච්චර දැන ගෙන හිටියෙ නැහැ. නමුත් මෙහි ආ පසු උනන්දුවක් ඇති වුණා. අනෙක ශිෂ්‍යත්වයක් ලැබුණු නිසා මම මෙහි සරසවියක් තෝරා ගත්තෙ නිවාඩුවට මට ගෙදර එන්න එච්චර කාලයක් ගත නොවන නිසයි.

**• ඇල්බොරාදා නිමායාගේ පළමු චිත්‍රපට රංගනයද?**
ඔව්.

**• කොහොමද මේ අවස්ථාව ලැබුණෙ?**
2020 මුලදී මම වේදිකා නිර්මාණයක් වෙනුවෙන් පෙර පුහුණුවීම් කරමින් සිටියේ. බිම්සරා ප්‍රේමරත්න තමයි එය අධ්‍යක්ෂණයට යොමුව සිටියේ. ඒත් කොවිඩ් වසංගත තත්ත්වය නිසා එහි ඉදිරි කටයුතු කැන්සල් වුණා. ඊට මාස දෙකකට විතර පසුව අසෝක හඳගම මහතා ඇල්බොරාදා චරිත සොයමින් සිටිය දී බිම්සරාගෙන් අහලා තියෙනවා. එතකොට එයා මාව රෙකමන්ඩ් කරලා. බිම්සරා මගේ අම්මාවත් හොඳින් දන්නවා. ඔව් ඉතින් ඒ විදියට තමයි මම 'පැට්සි' වුණේ. ඒක සතුටින් බාර ගත්තා.

**• ඔබ මෙහි රඟපාන චරිතය ගැන දෙපාරක් හිතුවෙ නැද්ද? මෙය සාමාන්‍ය චරිතයක්ම නෙවෙයි ?**
මේක වෙනස් තමයි. 'පැට්සි' බොහොම විවෘත, තරුණියක්. පැබ්ලෝ නෙරූද ප්‍රිය සම්භාෂණයකට ඇවිත් සිටි මොහොතක ඇය තමයි මුලින්ම ඔහු සමඟ කතා කරන්නෙ. 1920 හිටපු අවුරුදු 25ක විතර තරුණියකගේ චරිතයක් මම ඉදිරිපත් කරන්නෙ. ඇයගෙ වීරයකු වූ චරිතයක් මුණ ගැසීම ඇයට ගෙන දුන්නෙ විශාල සතුටක්. ඒ ස්වභාවය වටහාගෙන සහ චරිතයේ රංගනයේ දී පෙනී සිටීමට සිදුවන රූප රාමු වෙනුවෙන් රංගනයේ යෙදීම ඇත්තෙන්ම මට අභියෝගයක් වුණා. මම ඒ අභියෝගය බාර ගත්තා.
මේ චරිතය ගොඩනගා ගන්න මට අසෝක හඳගම මහතා බොහෝ සෙයින් උදවු වුණා. සාකච්ඡා සංවා ද කීපයකින් පසුව චරිතයට අවතීරණ වීමට හොඳ පරිසරයක් නිර්මාණය වූ බව කියන්න පුළුවනි.

**• ආචාර්යවරියක වන ඔබගෙ මවගෙ අවසරය ලැබුණ ද? ඇය කැමැති වුණා ද ඔබ මේ චරිතය කරනවට ?**
මගේ අම්මා තාත්තා දෙන්නාම 'තියටර්' එක එක්ක සම්බන්ධව කටයුතු කළ අය. ඒ බැඳීම, හැඟීම එයාලට තියෙනවා. රංගනය සහ සැබෑ ජීවිතය ගැන එයාලට හොඳ වැටහීමක් තියෙන්නෙ. අනෙක චරිතයත් රඟපෑම සහ සැබෑ ජීවිතය කියන්නෙ දෙකක්.

**• අද කොහොම ද මේ චිත්‍රපටය 'නිමායා'ට දැනෙන්නෙ?**
එක්වරම මෙහෙමයි, මේ විදියයි කියලා ඒකට උත්තර දෙන්න බැහැ. මගේ කරන චරිතය ගැන මටම විචාරයක් තිබිය යුතුයි තමයි. නරඹන්නකු ලෙස ගත්තොත් මම මේ නිර්මාණය වින්දනය කරනවා.

**• ඇල්බොරාදා සිනමා නිර්මාණයේ පැට්සි ලව් කරන්නෙ 'පැබ්ලෝ'ට, සැබෑ ජීවිතයේ දී නිමායාගේ ආදරය කොතැනද තියෙන්නෙ?**
මම හිතන්නෙ අධ්‍යාපනය එක්ක විෂයයත් එක්ක මම කාර්ය බහුලයි. ඒ හැරත් තවම මම උසස් අධ්‍යාපනය ලබන සිසුවියක්නෙ.

## නිමායා හැරිස්




## ඉංග්‍රීසි නාට්‍ය වේදිකාව හුරු පුරුදුයි

**• ඔබ හිතන විදියට 'ආදරය' කියන්නෙ මොකක් ද?**
ප්‍රේමණීය බැඳීමක්. පවුලේ අය එක්ක හිතමිත්‍රාදීන් එක්ක මගේ ඒ බැඳීම ගලා යනවා. දෙදෙනකු අතර ඇතිවන බැඳීමට වඩා එය වෙනස්. ආදරයේ දී තේරුම් ගැනීම සහ එකිනෙකාට පහසුවක් මෙන්ම මානසිකව සැහැල්ලු බවක් ඇතිවෙනවා නම් එය හොඳ දෙයක් වේවි.

**• 'නිමායා' සැබෑ ජීවිතයේ දී මොන විදියෙ ගති පැවතුම්වලින් යුතු කෙනෙක් ද?**
කොහොම ද ඒකට උත්තර දෙන්නෙ. කලාවේ වගේ මගේ ජීවිතය සසඳන්න බැහැ. මම තරමක් දුරට ඉගෙනුමට සමීප වූ ඒ හා සම්බන්ධ දේ සොයා යන චරිතයක් විය හැකියි.

**• ලංකාවේ ජීවිතය ගත කරන විදිය ගැන කියමු?**
අම්මා - තාත්තා එක්ක සහ අපේ ගෙදර සුනඛ සුරතලුන් තුන් දෙනෙක් ඉන්න නිසා වැඩිපුර කාලය ගෙවන්නෙ ඒ අය එක්කයි. නිතරම ගෙදර ඉන්න ආසයි. මගේ පාසලේ යාළුවෝ එක්ක කෑමට එළියට යන්න කැමැතියි. වැඩි කාලයක් රටින් පිට සිටින නිසා ගෙදර ආවාම ගෙදරම ඉන්න ආසයි.

සඳුන් ගමගේ



# ඕනෑම චරිතයක් රඟපාන්නම්



## ගාමිණී විජේවර්ධන

ඔහු නමින් සිරිදසය. ඒ චූලා ගේ පියාය. ගැමි චරිතයක අහිංසක පියකු ගේ චරිතයට පණ පොවන ඔහු සැබෑ ජීවිතයේ ගාමිණී විජේවර්ධනය.

දෙරණ රූපවාහිනියේ 'ඉස්කෝලේ' ටෙලිනාට්‍යය ඔස්සේ සතියේ දිනවල රාත්‍රී 7.30 ට සිරිදස ඔබේ ආලින්දයට පැමිණෙනු ඇත.

ප්‍රවීණ නාට්‍යවේදී සුගත් සමරකෝන්ගේ 'පුරන්අප්පු' වේදිකා නාට්‍යයෙන් කලා ලොවට අත්පොත් තබන ඔහු එතැන් පටන් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ ඇසුර ලබමින් ප්‍රවීණ ටෙලිනාට්‍ය අධ්‍යක්ෂ සිරිතුංග පෙරේරාගේ 'මුතුලන්ද' ටෙලිනාට්‍ය ඔස්සේ රූපවාහිනියට පිවිසියේය.

ගාමිණී තම කලා දිවිය ගැන මෙසේ අදහස් පළ කළේය.

"පසුගිය කොරෝනා වසංගතයත් එක්ක අපි හැමෝම බිමටම කඩාගෙන වැටුණා. විශේෂයෙන් කලාකරුවෝ විශාල අර්බුද රාශියකට මුහුණ දුන්නා. නැවත රට විවෘත කිරීමත් එක්ක යම් සැනසිලිදායක තත්ත්වයක් ඇතිවුණා. දැනට ටෙලිනාට්‍ය 6 ක් පමණ කරලා තියෙනවා. 'සිහිනයට පෑ දේදුන්නක් සේ', 'මහවිරු පණ්ඩු', 'පින්කෙත' ඇතුළු ටෙලිනාට්‍ය තුළින් ඉදිරියේදී දැකගන්න පුළුවන් වේවි. මේ දිනවල ජයන්ත චන්ද්‍රසිරි මහතාගේ 'නන්නත්තාර' ටෙලිනාට්‍යයේ දමරික චරිතකයකට පණ පොවනවා. මේ දිනවල එහි රූගත කිරීම් සිදුකරනවා.

ඒ වගේම 'ගාඩි', 'මිදුණු විශ්වය', 'සිරි සිද්ධා', 'යක්ෂා දේශය', 'ගුත්තිල' ඇතුළු චිත්‍රපට කීපයකත් රඟපෑවා. ඉදිරියේදී එම චිත්‍රපට තුළින් ඔබ හමුවට එන්නත් මා බලාපොරොත්තු වෙනවා. රංගනයට ආදරය කරන කලාකරුවෙක් හැටියට ඕනෑම අභියෝගාත්මක චරිතයකට පණ පොවන්න මට හැකියාව තියෙනවා. තවත් ටෙලිනාට්‍ය දෙක තුනකින් රංගනයට ආරාධනා ලැබී තියෙනවා. රංගනය තුළින් ජනහදවත්වලට සමීප වෙන්න මා බලාපොරොත්තු වෙනවා.

මේවන විට ප්‍රවීණ නාට්‍ය හා චිත්‍රපට අධ්‍යක්ෂ ජයන්ත චන්ද්‍රසිරි මහතා යටතේ වැඩිදුර රංගනය හදාරනවා. මෙතෙක් ක්ෂේත්‍රයේ රංගනයෙන් දායකවීමට උදවු උපකාර කළ සියලු දෙනාටම ස්තූතිය පුදකිරීමට අවස්ථාවක් කර ගන්න අතර 'ඩිල් ෆිල්ම්ස්' ආයතනයේ ලාල්, ප්‍රවීන් ජයරත්න, උදිත ගුණරත්න යන මහත්වරුන්ට මගේ හෘදයාංගම ස්තූතිය පුදකිරීමට මෙය අවස්ථාවක් කරගන්නවා."

**ගයාන් සූරියආරච්චි**




# ලොතරැයි ප්‍රතිඵල
දිනපතා එසැනින් SMS මගින් ලබාගැනීමට
ඩයලොග්, එයාටෙල් හෝ හච් දුරකතනයක් නම්
REG LOTD ලෙස ටයිප් කර 77000 ට SMS කරන්න
*මසකට රු. 30+TAX
මොබිටෙල් දුරකතනයක් නම්
REG LOTD ලෙස ටයිප් කර 77013 ට SMS කරන්න
*පෙරගෙවුම් සඳහා දිනකට රු. 1+TAX *පසුගෙවුම් සඳහා මසකට රු. 30+TAX



# ආශිර්වාද මංගල සේවය
සාර්ථක යුග දිවියක ඇරඹුම...
දෙමාපියනි, දුවගේ පුතාගේ විවාහය ප්‍රමාදවීම ගැන ඔබ තවමත් සිත්තැවුලෙන් ද ?
විවාහ අපේක්ෂකයිනි,
ඔබට ද සෘජුවම අප හා සම්බන්ධ විය හැක.
දික්කසාද / වැන්දඹු හෝ සුළු ආබාධ සහිත ඔබටද අවස්ථාව ඇත.
0766 928 628 / 0717 928 628
ඇමතුමක් ලබාදී ( උදේ 8 - සවස 5 ) හෝ
https://www.ashirwada.lk
වෙත පිවිසීම මගින්
නොමිලේ ලියාපදිංචි වෙන්න.
ඔබටම ගැලපෙන යෝජනා ඡායාරූප සමගම ලබාගන්න.
යෝජනා දුරකතනයටම (Wapp/Viber/Imo) මගින් හෝ තැපෑලෙන් ගෙන්වා ගන්න. ආයතනයට වේලාවක් වෙන්කර ගෙන පැමිණ, එවලේම යෝජනා ලබා ගන්න. යෝජනා ලැබුනු පසු මුදල් ගෙවන්න.
විවාහයක් වන තුරුම ඔබගේ ලියාපදිංචිය වලංගු වේ
*ඔබගේ පෞද්ගලිකත්වය අතිශය ආරක්ෂා කෙරේ*
(නොමිලේ ලියාපදිංචි වන සෑම යෝජනාවක්ම අපගේ වෙබ් අඩවියේද පලකෙරේ)
පහළකරගහමූණ, කඩවත
රජයේ ලියාපදිංචි ආයතනයකි. WR 15625
ashirwadaproposals@gmail.com


## අහස් ලියුම

නෙතු පියාගම් සිහිනයෙන් වත්
ඔබ දකින්නට සිතාගෙන
මට කියනවාද මවෙත එනවද
හසගනක් සේ සිනා ගෙන

රෝස මල ඔබ උදපින්නේ
නැහැවී නැහැවී පුබුදුවන
නෙලාගන්නට වරම් නැතිමුත්
දෙනෙත් අද්දර සිනා සෙන

සුවඳ පොද ඔබ සීත පවනේ
වෙලී පැටලී හමා යන
මගේ වෙන්නට වරම් නැති මුත්
හාදු වැස්සක තුරුලු වන


**ශකුවි**



සිතුවම: සමන් කළුබෝවිල


# හද ගැස්ම මංගල සේවය
ඔබ කුමන තරාතිරමක අයෙක් වුවද ඔබට සුදුසුම සහකරු හෝ සහකාරිය අපගේ දහස් ගණනක් යෝජනා අතරින් පැයක් ඇතුලත අප සොයා දෙන්නම්..
ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ඔබ බලාපොරොත්තු වනම ආකාරයේ හොඳම යෝජනා ඡායාරූප ද සහිතව පැයක් ඇතුළත එවීම සිදු කෙරේ.
ලියාපදිංචි වීමට හා විස්තර දැනගැනීමට 076 - 2200 533 ට දැන්ම මිස් කෝල් එකක් දෙන්න.
ප්‍රධාන කාර්යාලය : පොලීසිය අසල, නිට්ටඹුව
ශාඛා : KFC පිටුපස, කුරුණෑගල
ලියාපදිංචිය නොමිලේ...
076-2200533
071-0500502



# පොඩ්ඩන්ගේ Online Art Campඑක
අවුරුදු 4 - 6 | අවුරුදු 7 - 9 | අවුරුදු 10 - 14
යන වයස් ඛාණ්ඩ යටතේ සතියේ දිනවල සහ සතිඅන්ත දිනවල පන්ති පැවැත්වේ.

නොමිලේ
පවත්වන චිත්‍ර වැඩමුළුවට පොඩ්ඩනි එන්න
මාර්තු 17 zoom
පෙරවරු 10ට අවුරුදු 4 - 6
පස්වරු 01ට අවුරුදු 7 - 9
පස්වරු 04ට අවුරුදු 10 - 14
මෙම වැඩමුළුවලට සහභාගීවීම සඳහා "Kids Art Camp" යනුවෙන් type කර පහත දී ඇති අංක 2න් එකකට WhatsApp කරන්න.

T - kal Media
0771 277 540 / 0774 768 308
සංවිධානය : Art for Life Kids Virtual Art Camp
Art for Life Kids Art Camp
Kids art Camp
මෙහෙයවීම : මෙරට ළමා චිත්‍ර කඳවුරු ක්‍රමය මෙන්ම Portrait චිත්‍ර කලාව ප්‍රචලිත කළ ජාත්‍යන්තර කීර්තියටපත් චිත්‍ර ප්‍රහුණුකරු
තිලක් කලු ලියනගේ
www.thilakkalu.com

සැඳෑ සක්මන අහවරයි දැන්
ලෝ දහම හංගා ගෙනා
ලිහී වැටුණත් පරවෙලා පෙති
සුවඳ යන්නේ නෑ දමා

මගේ හුස්මට තුරුළු වී හිඳ
යන්න ගියෙ නුඹ මා දමා
ජීවිතය දුන් ආදරේ තැන්
තවම නෑ නුඹහට කියා

සසර ගමනේ නවාතැන් හිමි
තැනක හමු වී පෙම්කළා
කොහොම යන්නද ඉතිරි දුර මා
මටත් කලියෙන් නුඹ ගියා

ගී උල්පත




# සැඳෑ සක්මන අහවරයි දැන්

## චන්දන ලියනආරච්චිගේ හඬින් නෙලූ එස්. ප්‍රනාන්දු ගේ ගී පද


චන්දන


නෙලු


රෝහණ

"අපේ ජීවිත කාලෙ හරිම කෙටියි. තරහ වෙලා ඉන්න දවසක් වත් නෑ."

**ඒ සති අන්තයේ නිවාඩුව දීර්ඝ එකක් විය. සිකුරාදාට අමතරව සඳුදාද නිවාඩු දින වූ බැවිනි. බ්‍රහස්පතින්දා වරුවක් නිවාඩුගත් ඇය ගෙදර යන්නට සැරසුණාය.**

අත් බෑගයට අමතරව ඇඳුම් බෑගයද ගත් ඇය නවාතැනින් පිටව එහි දොර වැසුවාය.

සූ ට කියල යන්න ඕනෑ

එක්වරම ඇගේ යටිහිත ඇයට මතක් කළේය.

ඇඳුම් බෑගය දොරට හේත්තු කළ ඇය ජංගම දුරකථනය අතට ගත්තේ ඔහු අමතන්නටය.

සූ මා එක්ක තරහනෙ

ඇගේ උඩුහිත කීවාය.

කුමක් කරම්දෝයි සිතා ගන්නට බැරිව යටිහිතත් උඩුහිතත් සමග තර්ක තරමින් ඇය මොහොතක් ගත කළාය.

ඇගේ මතකය දිවගියේ මාසයකට පෙර අවසන්වරට ඔහු හමුවූ මොහොතටය.

''අපි යමු බීච්''

එදා ඔහු කීවේ ඇගේ මුහුණට එබෙමිනි.

''යමු ''

දෙවරක් නොසිතාම ඇයද කීවාය.

ඔහුගේ යතුරු පැදියට නැගුණ ඇය ඔහුගේ ඉඟ හරහා දෑත දමා ඔහුට තුරුලු වූවාය. ඔහු යතුරු පැදිය පැදවූයේ කුරුල්ලකු ලෙසිනි.

ඔහු ගියේ ගල්කිස්සේ වෙරළටය. ඒ සුන්දරම සන්ධ්‍යාවකි. බටහිර අහස පාට බාල්දියක් හැලූ කලෙක මෙනි. දම් තැඹිලි රතු වැනි පාට බොඳවුණු සිතිජයේ හිරු රතුපාට බෝලයක්ව පෙනිණි.

''සංජු''

එක්වරම ඇසුණ කටහඬින් ඇය පුදුමයට පත්විය.

ඒ කවුදැයි බලන්නට පසුපස හැරුණු කළ ඇය දුටුවේ වසර පහළොවකට පෙර හමුවී නික්ම ගිය ඇගේ ප්‍රථම ප්‍රේමයේ පෙම්වතාය.

''ඕ... ඔයා? නිසල්''

ඇයට ගොත හැසිණි.

''මේ මගෙ බෝයි ෆ්‍රෙන්ඩ්'' ඇය වහා තමා ළඟ සිටි සූ ඒ පරණ පෙම්වතාට හඳුන්වා දුන්නාය.

ඇගේ වදන් ගණනකට නොගත් නිසල් ඇය දෙසම බලා සිටියේය.

''සංජු ඔයා එදා වාගේමයි. තාමත්... ඒ ඇස් දෙක.., ඒ හිනාව... එදා තිබුණ ආදරේ විතරද වෙනස් වුණේ.''

නිසල් පිස්සුවෙන් මෙන් කියාගෙන ගියේය.

ඇය ඔහුට කන් දුන්නේ විටින් විට සූ දෙසද බලමිනි.

තමන්ට අතීත ප්‍රේමයක් තිබූ බව ඇය කවදාවත් සූට කියා නොතිබිණි.

සූ ඇගේ සුරතින් ඇද්දේය.

ඇගේ දෙනෙතට එබී බැලූ ඔහුගේ දෙනෙතේ වූයේ රැවුමකි.

''මොකාද ඒ''

ඔහු ඇසුවේ කෝපයෙනි.

''මගෙ යාළුවෙක්.. ඉස්කෝල කාලෙ''

ඇය තෙපුළාය.

''යාලුවෙක්ද බෝයි ෆ්‍රෙන්ඩ්ද?''

ඔහු ඇගේ දෑසටම එබී බැලුවේය.

ඇය නිසල් කොහිදැයි බැලුවාය. ඔහු දුරට වී බලාගෙන සිටියේ තමා දෙසම බව ඇයට පෙනිණි.

''කතා කරනවා''

''යාලුවෙක්''

ඇය කීවාය.

''බොරු කියන්න එපා අයිසේ. ඒ කොල්ලා තමුසෙගෙ බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් කිව්වා ඇහුණෙ නැද්ද? ඇස් ඒවමයි, හිනාව ඒවමයි, ආදරේ විතරයි වෙනස් කියලා.

මට කියනව මං ඔච්චර අහලත් තමුසෙ ඌ ගැන මට නොකිව්වෙ ඇයි කියලා?''

ඔහු ඇගේ අත රිදෙන තරමට තදින් මිරිකුවේය.

''ඒක පරණ අතීතයක්. මම ජීවත්වෙන්නෙ වර්තමානයෙ. ඒ නිසා මං අතීතය අමතක කරලා තිබ්බෙ''

ඇය කීවාය.

''ඒ වුණාට ඒ කොල්ල දැක්කාම තමුසෙට අතීතෙ මතක් වුණානෙ''

ඔහු ඇසුවේය.

උත්තරය 'ඔව්' වුණත් ඇය කිසිවක් නොකීවාය.

''අර බලනව ඒ කොල්ල තාමත් තමුසෙ දිහා බලගෙන ඉන්නවා. යනවා ගිහින් ඌ එක්ක....''

ඔහු තදින් ඇය තල්ලු කළේය.

ඇය වෙරළ මත ඇද වැටිණි.

ඔහු දිවගොස් යතුරුපැදියට නැගුණේ ඇය වෙරළෙහි තනිකර දමාය. එහෙත් නැගිට ගත් ඇය ඔහු පසුපස දිව ගියාය. ඔහු යතුරු පැදියට නැග වේගයෙන් ධාවනය කරද්දී ඇය හැඬුවාය.

අන්තිමේදී කුලී රියක නැගී සිය නවාතැනට ගියාය.

ඉනික්බිති මේ වනතුරුම ඔවුනතර කතාවක් ඇති වූයේ නැත. තමා තේරුම් නොගැනීම ගැන ඇයත්, තමන්ට සත්‍යය සැඟවීම ගැන ඔහුත් සිටියේ කෝපයෙන් නිසාය.

කමක් නෑ... මං යනවා කියලා එයාට කියනවා.

අන්තිමේදී තීරණය කළ ඇය ඔහු ඇමතුවාය.

''මං අද ගෙදර යනවා.

ඔයාට කියන්න ගත්තේ.''

ඇය කීවාය.

''සංජු''

ඔහු කතා කළේ අපහසුවෙනි.

ඔහුගේ වෙනස ඇයට මොනවට දැනිණි

''සූ ඇයි ඔයාට මොකද?''

සියලු තරහ මරහ අමතක වූ ඇගේ හිතේ උපන්නේ හුරුපුරුදු ප්‍රේමයයි.

''මට කොවිඩ් පොසිටිව් වුණා. හොඳටම අමාරුයි. ඉන්නෙ අයි.ඩී.එච්. එකේ''

ඔහු කීවේ එපමණකි.

දුරකථනය ඈ අතින් ගිලිහී වැටිණි. දෝතින් මුහුණ බදාගත් ඇය හොඳටෝම ඇඬුවාය.

ගමේ යාම අමතක කළ ඇය ආපසු නවාතැන් කාමරයට ගියාය. යහන බදාගත් ඇය හොඳටෝම ඇඬුවාය.

සූ ජීවිතයෙන් සමුගෙන යනු ඇතැයි ඇගේ සිතට සිතෙමින් තිබිණි. ඔහු කතා කළේ බොහෝ අපහසුවෙන් නිසාය.

එදා සිට හැමදාමත් දවසට දෙවරක් ඇය රෝහල් වාට්ටුවට කතාකර සූ ගේ සුවදුක් සොයා බැලුවාය.

ඇගේ සිතේ වූ සංවේදනාව කියන්නට ඇයට මතක් වූයේ නෙලූය.

ඇය සියල්ල මිතුරිය සමග බෙදාගත්තාය.

සතියකට පසු...

ඔව් සතියකට පසු සූ යළි නොඑන්නම නික්ම ගිය බව ඇයට පැවසුවේ රෝහල් වාට්ටුවේ හෙදියක විසිණි.

මහ හඬින් විලාප දුන් ඇය යහන බදාගත්තේ දුක කඳුලක් කර කොට්ටයට මුසු කරන අදහසිනි.

''එදා තරහ නොවුනානම් සූ ට මෙහෙම වෙන එකක් නෑ. එහෙමනම් මම එයා අසනීප වුණ හැටියෙම හොස්පිට්ල් යවනවා.''

ඇය කීවේ නෙලුටය.

''අපේ ජීවිත කාලෙ හරිම කෙටියි. තරහ වෙලා ඉන්න දවසක් වත් නෑ.''

නෙලූ ඇයට පැවසුවාය.

සංවේදී වූ නෙලූ ප්‍රනාන්දුගේ හිතට ගලා ආ වදන් වැල අත්තිමේදි රෝහණ වීරසිංහගේ සංගීතයෙන් හැඩ වී චන්දන ලියනාආරච්චිගේ හඬින් ගැයිනි.


සැඳෑ සක්මන අහවරයි දැන්
ලෝ දහම හංගා ගෙනා
ලිහී වැටුණත් පරවෙලා පෙති
සුවඳ යන්නේ නෑ දමා.

**ශාන්ත කුමාර විතාන**

සිතුවම: සමන් කළුබෝවිල

**ශානක** - සොරි වෙච්ච දේට.
**ගෞරි** - හරි මම යන්නම්.
**ශානක** - ගෞරි අපි ටිකක් කතා කරමු. ප්ලීස්... මටත් අමාරුයි.
**ගෞරි** - මට බෑ ශානක. මං කතා කරන්න පුළුවන් වුණාම ඔයාට කියන්නම්. ඇත්තටම මං ඉන්නේ ලොකු අවුලක.
**ශානක** - අපි පොඩ්ඩක් කතා කරමු. ගෞරි... ඔහොම වෙන්න එපා.

**මේ 'ශානක' වගේම 'ගෞරි' අපට හමුවන්නෙ, ආනන්ද අබේනායක ප්‍රවීනයාගේ 'පීතෘ' ටෙලි මාලාව ඔස්සේය. මෙහි ශානක වූ ඔහු ගෙවින් අභිෂේක් ය. පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයෙන් උගෙන ගෙන සා/පෙළ ඒ සමාර්ථ 9ක් සමග විශිෂ්ට ලෙස සමත් වූ ගෙවින් ඇයි මේ විදියට රංගනය තෝරා ගත්තෙ? කවුද මේ ගෙවින්? ආනන්ද අබේනායක ප්‍රවීනයාගේ තවත් අපූරු ටෙලි නිර්මාණයක් ලෙස 'පීතෘ' විකාශය කෙරෙන මොහොතක එහි ගෙවින් සමග අපි පිළිසඳරක යෙදෙමු.**





# 'මිලේනියම්ස්'ලා ජීවිතයෙන් මග හරවාගත් දේවල් බොහොමයි

**• 'ගෙවින්', සම්පූර්ණ නම දැන ගන්න කැමතියි?**

ගෙවින් ශ්‍යාම් අභිෂේක් කුලතුංග.

**• හින්දි නමක් වගේ නේද? කවුද මේ නම දැම්මෙ?**

අම්මයි තාත්තයි දෙන්නම එකතුවෙලා තමයි.

**• අම්මයි තාත්තයි ගැන කියමු?**

තාත්තා ගැන රටේ බොහෝ දෙනෙක් දන්නවනෙ. තාත්තා රංගන ශිල්පියෙක්. ඊට අමතරව තාත්තා ව්‍යාපාරිකයෙක්. තාත්තාගෙ නම චින්තක කුලතුංග. අම්මා වේෂ නිරූපණ ශිල්පිනියක් ලෙස ඉස්සර කටයුතු කළා. අම්මගෙ නම රන්ජුලා ශ්‍රීමාලි.

**• පෙනුමින් තාත්තයි පුතයි, අයියයි මල්ලියි වගේ නේද පෙනෙන්නේ?**

හැමෝම වගේ ඔය කතාව කියනවා. අපි දෙන්න එකට ගමනක් ගියොත් මේ ඔයාගේ මල්ලිද කියලා තමයි මිනිස්සු තාත්තාගෙන් අහන්නෙ.

**• ගෙවින් කියන්නද? අභිෂේක් කියන්නද?**

ගෙවින් හොඳයි. තාත්තා ඉස්සර වැඩ කළේ පිටරට. සමහර අවස්ථාවලදී අපේ නම් උච්චාරණය කරන්න අමාරුයිලු. ඉතින් ඒ නිසා ඉදිරිය ගැන හිතලයි තාත්තා මට නම දලා තියෙන්නෙ.

**• තාත්තා මෑතකදි රඟපෑවෙ ආචාර්ය සෝමරත්න දිසානායකගෙ 'ජංගි හොරා' චිත්‍රපටයේ නේද?**

ඔව්.

**• තාත්තා ලංකාව හැර ගිහින්ද?**

නැහැ. අපේ මල්ලි ඉගෙන ගන්නෙ කැනඩාවෙ. ඉතින් තාත්ත කෙටි නිවාඩුවකට එහේ ගිහින් ඉන්නෙ.

**• පවුලේ විස්තර කොහොමද?**

අපේ පවුලේ අම්මයි, තාත්තයි, ආච්චියි, මල්ලිලා දෙන්නයි, නංගියි, මමයි.

**• ගෙවින් කලා අංශයට ආවෙත් අම්මා - තාත්තා දෙන්නම කලාකරුවෝ වෙච්ච නිසාද?**

පොඩි කාලයේදී තාත්තා කලා වැඩවලට යද්දි මල්ලිලා එහෙම එක්කගෙන ගියා. මට කතා කළාට ඒ ගැන මට උනන්දුවක් තිබුණෙ නැහැ. මට ඒ උනන්දුව ආවෙ සා/පෙළට නාට්‍ය හා රංග කලාව තෝරා ගත්තට පස්සෙයි. එක වසරෙ ඉඳලම මම ඉගෙන ගත්තෙ පන්නිපිටියේ ධර්මපාල විද්‍යාලයෙන්. අපේ නාට්‍ය ගුරුවරයාව හිටියෙ ඉන්ද්‍රප්‍රිය උදිත කුමාර. එතුමාගේ මගපෙන්වීම නිසා නාට්‍ය හා රංග කලාවට අවතීර්ණ වුණා. සා/පෙළ 'ඒ' සමාර්ථ 9ක් ගත්තා. ඒ විදියට පාස් වුණාම රෝයල් හෝ ආනන්දය වගේ පාසලකට යන්න අවස්ථාව තිබුණත් කලාවට තෝතැන්නක් වෙච්ච ධර්මපාල විද්‍යාලය දලා මම ගියේ නැත්තේ, කලාවට හිත ගිහින් තිබූ නිසයි. උසස් පෙළට තෝරා ගත්තෙත් නාට්‍ය හා රංග කලාවයි. පසුව සෞන්දර්ය සරසවියට තේරුණා. ඒත් වැඩිදුර මේ විෂය හැදෑරීමට තිබුණු ආසාව උනන්දුව නිසා තාත්තා මාව ඕස්ට්‍රේලියාවට යැව්වා. උපාධිය කරමින් සිටියෙ එහිදියි. එහේ සිටින විට මම කුඩා කාලයේ ඉඳලාම ආසා කළ සුදත් දේවප්‍රිය සර්ගෙ නාට්‍යයක රඟපෑමට අවස්ථාව ලැබුණා. ඒ පාර උපාධියෙ වැඩ හමාර නොකරම මේ චරිතය කරන්න ලංකාවට ආවා. 2020දී 'සුළඟ මහමෙරක' නම් වූ ඒ නාට්‍යය විකාශය වුණා. මෙවර රයිගම් උළෙලේදී සම්මානයටත් ඒ චරිතය නිර්දේශ වෙලා තියෙනවා.

## රංගනයෙන් විතරක් ජීවත්වෙන්න අමාරුයි

**• ඒ නාට්‍යයේද මුලින්ම රඟපෑවේ?**

මුලින්ම රඟපෑවේ බුද්ධික දමයන්තගෙ වේදිකා නාට්‍යයක. ඊට පස්සෙ 'පිත්තල කොණ්ඩෑරුම' නාට්‍යයේ රඟපෑවා. ඉන්පසුව රඟපෑ ලක්මිණී අමරදේවගෙ 'ඉස්කෝලෙ කාලෙ' නාට්‍යයේ චරිතය නිසා බොහෝ දෙනෙක් මා ගැන කතා කරන්න පටන් ගත්තා. පාසල් කාලයේදී වුෂු ක්‍රීඩාව කරමින් ජාතික තලය දක්වා ආවා. ඒ පරිසරය එක්ක ෆිල්ම්වලට එහෙම ඒමේ ආසාවක් තමයි යටි හිතේ තිබුණෙ. ඒ කාලයේදී කෞෂල්‍යා මිස්, ප්‍රසන්නජිත් සර්ලා යටතේ පවා නාට්‍ය හා රංග කලාව ගැන ඉගෙන ගනිමින් හිටියෙ.

**• ඕස්ට්‍රේලියාවට ඉගෙන ගන්න ගිහින් ඇයි ආපහු ලංකාවට එන්න හිතුවේ. මොකද ඒ රටට ගියාම බොහෝ දෙනා ආපහු එන්නෙ නැහැ?**

මටත් ලෙහෙසියෙන්ම ඉන්න තිබුණා. මුලින්ම රටකට කියලා ගියෙත් ඕස්ට්‍රේලියාවට. ඒත් මාස හයක් විතර යනකොට මට දැනුණෙ ඒකාකාරී ජීවන රටාවක්. ලංකාවේ තිබූ නිදහස, ෆැමිලි එක, මිනිස්සු හඳුනන එක ඒ කිසිවක් එහිදී නැහැනේ. ඊට වඩා මම ආදරය කරන ක්ෂේත්‍රයේ වැඩක් ලැබුණාම ආයෙත් මෙහේ එන එක හොඳයි කියලා හිතුවා.



ගෙවින් අභිෂේක්

**• අද ගෙවින්ගෙ ප්‍රධාන වෘත්තිය?**

රංගනය තමයි තෝරාගෙන තියෙන්නෙ. ලංකාවේ විදියට එම වෘත්තියෙන් විතරක් යැපිලා සැප පහසු ජීවිතයක් ගත කරන්න අමාරුයි. ඒ නිසා අපේ තාත්තාගෙ හෝටල් ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ වෙලා ඒ වැඩ ටික බලාගෙන ඉන්නවා.

**• ගෙවින් ටිකක් ආඩම්බරකාරයෙක් කියලයි සමහරු කියන්නේ?**

අනේ මම එහෙම නැහැ. හැබැයි රංගනයේදී නිතරම වෙනස් විදියෙ චරිත ගැන හිතුවා. ඒ නිසාම පාසල් කාලයේ ඉඳලාම මට තිබුණු ආරාධනා අතරින්, බාරගත්ත චරිතවලට වඩා බාර නොගන්න චරිත ඉහළයි. මට මතක විදියට චරිත හතළිහක් විතර ඒ විදියට අත්හරින්න ඇති. ඒක ලොකුකමකට නෙවෙයි. රංගනයේදී වුණත් චැලේන්ජ් එකක් බාර ගන්න මම ආසයි. ඒ නිසා දැනෙන හැඟෙන නිර්මාණයකට දායක වීමට කැමතියි.

**• 'පීතෘ' නාට්‍යයේ 'ශානක' ගැන විස්තර කරමු?**

ශානක කියන්නෙ ගෞරිගෙ පෙම්වතා. ශානක කියන්නෙ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්. මේක ඇත්තටම වෙනස් කාලෝචිත කතාවක්. නාමල් ජයසිංහගෙ තවත් සංකීර්ණ පිටපතක්. මම හිතන විදියට ආනන්ද අබේනායක ප්‍රවීනයා, නැත්නම් අබේනායක සර්, නිර්මාණය කළ මෙම නාට්‍යය සෑම තරුණ තරුණියක්ම නැරඹිය යුතු කතාවක්. මේ කතාව පටන් ගන්නෙම වෙනස්ම තැනකින්. ඒ කියන්නෙ සමාජයේ අහන්න දකින්න ලැබුණට අපි කතා නොකරෙන මාතෘකාවකින්. 2000න් පස්සේ ඉපදුණු අයට කියන්නේ මිලේනියම්ස්ලා කියලනෙ. ඒ අය තාක්ෂණය නිසා ජීවිතයෙ මගහරවා ගත් දේ බොහෝමයි.

**• පීතෘ කතාවෙ ශානක ආදරය කරන්නෙ ගෞරිටනෙ. සැබෑ ජීවිතයේදී ගෙවින් ආදරය කරන්නේ?**

මිනිස්සුන්ට මම ආදරය කරන කෙනෙක්. පරිසරයට, සතුන්ට ඒ ඔක්කෝටම ආදරය කරන කෙනෙක්.

**• ප්‍රශ්නෙන් පිට නොයා, ඇත්තම කියන්න. පෙම්වතිය කවුද?**

මම පෙම්වතෙක්. ඔව් ඒක හරිම සුන්දරයි.


**• 'මට හිතෙන විදියට මම' කියන මාතෘකාව යටතේ ගෙවින්ට මොනවද කියන්න පුළුවන්?**

සාමාන්‍ය ජීවිතයේදී මම එතරම් කතාබහ කරන චරිතයක් නෙවෙයි. කොහොමටත් මම ගැන මම කියනවාට වඩා පිටස්තර අය කියන එක හොඳ බව මගේ හැඟීමයි.



සඳුන් ගමගේ

# එරංග සේනාරත්න



මේ දක්වා ටෙලි නාට්‍ය 42ක් පමණ නිර්මාණය කළ ඔහු සිනමා නිර්මාණ 12ක් අධ්‍යක්ෂණය කර තිබෙනවා. ඔහුගේ 11 වැනි සිනමා නිර්මාණය ලෙස 'මොනාලිසා' චිත්‍රපටය මේ දිනවල තිරගත වෙනවා. සිනමාවට රූපවාහිනියට නිරන්තරයෙන් අධ්‍යක්ෂණයේ භූමිකාව සමඟ දායකත්වය ලබාදෙන ඒ ප්‍රවීණ නිර්මාණකරුවා, එරංග සේනාරත්නය. ඔහු මේ විදියට අද අප සමඟ එක්වන්නේ 'මොනාලිසා' නිසා අත්විඳි සියල්ල ගැන හෙළිදරව් කිරීමටය.

**• එරංග, 'මොනාලිසා' ඔබගේ අනෙකුත් නිර්මාණ හා සසඳද්දී මොන වගේ නිර්මාණයක් ද?**

මොනාලිසා මගේ සිනමා නිර්මාණ දිවියේ සුවිශේෂී කඩඉමක්.


**• ඒකට හේතුව?**

එතෙක් මම සිනමාකරණයේ යෙදුණේ, ජනප්‍රිය රැල්ලේ කතා තේමා රැගත් චිත්‍රපට එක්ක. ඊට වඩා වෙනස් වෙච්ච එක්තරා විදියක අත්හදා බැලීමක් ලෙස මම මොනාලිසා කළේ.



**• සිනමා ජීවිතයේ ආ මග වෙනස් කරලා, වෙනත් මගත් යන්න හිතුවෙ?**

මොනාලිසා තිරපිටපත ඇතුළේ 'කල්පනා' නමැති ප්‍රධාන තරුණිය අපට හමුවෙනවා. ඇය තමයි මේ චිත්‍රපටයේ කතා නායිකා චරිතය. එය ඉතා සංකීර්ණ චරිතයක්. මොනාලිසා චිත්‍රය ගත්තොත් අපි ඒක දශක ගණනාවක්, තිස්සේ විවිධ කෝණවලින් රස විඳි මහා චිත්‍රයක්. ඒ රූපයෙහි ඇති ගුප්ත බව එක්ක ලෝක සමාජයේ බොහෝ දේ කතා වෙලා තියෙනවා. ඒ රූපය දිහා බලාගෙන ඉන්නකොට අපි දිහා බලාගෙන ඉන්නවා වගේ හැඟීමක් ඇතිවන්නෙ. ඒ සියලු කාරනා එක්ක ගත්තාම මේ චිත්‍රපටයේ කල්පනාගෙ චරිතයත් ඒ වගේ සංකීර්ණ චරිතයක්. ඒ නිසාම මේ චිත්‍රපටයේ තේමා පාඨය ලෙස මම යොදා ගන්නෙ ''ඔබේ ඇසින් මා දකින්න'' කියලයි. මේක කාලීනව සමාජයට වැදගත් පණිවුඩයක් ලබාදෙන චිත්‍රපටයක්. ඒ නිසයි එතෙක් ආ මගට එහා ගිය වෙනස් නිර්මාණයකට අත ගැසුවේ.



**• මොනාලිසා, ෂූටිං තිබුණෙ කොහේ ද? එතකොට මොනාලිසා කතාව මොන වගේ ද?**

මේ කතාවෙ හැටියට කොළඹ නගරය හා ඒ අවට පළාත් යොදා ගත්තෙ. හැබැයි අපි මේ වැඩේ පටන් ගත්තෙ කෝවිඩ් නිසා, රටේ, ලෝකයේ සියලු කටයුතු අකර්මණ්‍ය වී තිබූ මොහොතකදීයි. වත්මනෙහි විවිධ හේතු මත සිය දිවි නසා ගැනීම් අපට අහන්න දකින්න ලැබෙනවා. තරුණ, තරුණියන් ඇයි එහෙම කරගන්නෙ? එකී කාරනා එක්ක කිසියම් පර්යේෂණාත්මක නිර්මාණයක් කිරීමටයි මට ඕනෑ වුණේ. කල්පනා නමැති තරුණිය යම්කිසි සිදුවීමකට මුහුණ දීම නිසා ඇයට ඇතිවන ආවේගශීලි හැඟීම් නිසා ඇය සිය දිවි හානි කරගන්න තැනකට පත්වෙනවා. ඒත් ඒ අභිමිවීම කරා යන අවසාන නිමේෂයේ දී ඇයට හමුවන එක්තරා පුද්ගලයකු නිසා ඒ සියදිවි නසා ගැනීම නතර වෙනවා. ඉන්පසුව ඔවුන් දෙදෙනා අතර ඇතිවන කතාබහ තමයි, සංවාදය තමයි චිත්‍රපටය ඔස්සේ ගලා යන්නෙ. රූගත කිරීම් වැඩි හරියක්ට කළේ මොරටුව, පානදුර, මතුගම, කළුතර සහ කොළඹ ආශ්‍රිතව. 2021 ජුනි මාසයේ දී චිත්‍රපටයේ වැඩ පටන් ගන්නෙ. කෝවිඩ් සීඝ්‍රව පැතිරී තිබූ මොහොතක තමයි රූගත කිරීම් පටන් ගන්නෙ. ඒ නිසාම සමහර ප්‍රදේශ ලොක් ඩවුන් වූ නිසා, අපට ඒ ප්‍රදේශ මග හැරුණා.

**• එවැනි වාතාවරණයක දී නළු නිළියන්ට නවාතැන් එහෙම දුන්නෙ කොහොම ද?**

කොළඹ ආශ්‍රිතව සිටි නිසා ඒ කාටවත් අපි නවාතැන් පහසුකම් දුන්නෙ නැහැ. එදා දවසේ වැඩ ඉවර කළාම එයාලාව නිවෙස්වලට ඇරලුවා. නමුත් අපේ කාර්මික අංශයේ පිරිසට අපි හෝටලයක් වෙන් කර දුන්නා. ඒ වන විට හෝටලුත් වහලා තිබුණෙ. ඒ හෝටලය එදා වෙන් වූයේ අපේ කණ්ඩායමට විතරයි. ඒ නිසා සාමාන්‍ය විදියට කඩ හෝටල විවෘත වී නොතිබුණු නිසා, අපි දහසකුත් ප්‍රශ්න මැද්දේ රූගත කිරීම් කළේ. අපි මේ වැඩේ 2021 ජුනි වලදී වැඩ ඇරඹුවාම බොහෝ දෙනෙක් මගෙන් ඇහුවෙ උඹට පිස්සුද කියලයි. රටේ සියලුම කඩ, සාප්පු වැහිලා, ජන ජීවිතය සම්පූර්ණයෙන් ඇණහිට තිබූ මොහොතක චිත්‍රපටයක් කිරීම ඇත්තටම මෝඩ වැඩක් කියලයි හැමෝම වගේ කිව්වෙ. නමුත් මට ඕනෑ වුණේ, කාලීනව වැදගත් පණිවුඩයක් ලබාදෙන මේ චිත්‍රපටය මේ විදියට කරලා, හැකි ඉක්මණට තිරගත කරවීමට සැළැස්වීමයි. ඒ දේ මට මගේ කණ්ඩායම, නිෂ්පාදකයන් දෙදෙනා සමඟ එක්ව කරලා පෙන්නුවා.

**• මේ චිත්‍රපටය මෙච්චර ඉක්මණට තිරගත කරන්න පුළුවන් වුණේ කොහොම ද?**

ඒකට මම විකල්ප බෙදාහැරීමක් අනුගමනය කළා.

**• මොකක්ද විකල්ප බෙදාහැරීම කියන්නෙ?**

විවිධ මණ්ඩලවල සිනමාහල් තෝරා ගත්තා. සීමිත සිනමාහල් සංඛ්‍යාවක සීමිත දින ගණනකට මූලික වටයේ දී බෙදා හැරියා. ඒ අනුව දිවයිනේ විවිධ ප්‍රදේශවල සිනමාශාලා 14ක දැනට මොනාලීසා ප්‍රදර්ශනය වෙනවා. මණ්ඩල පහේම හිඩසක්, ගැප් එකක් තියෙන ඒවයෙහි මොනාලිසා නරඹන්න පුළුවනි.

**• මෙම මොනාලිසා චිත්‍රපටයට ඔබ ප්‍රධාන චරිතයට තෝරාගෙන සිටින්නෙ අලුත් මුහුණක්? ජනප්‍රිය රැල්ලේ නොවූ, පිරිසක් මෙම චිත්‍රපටයට යොදා ගන්නෙ?**

සිනමාව කියන්නෙ රස උපදවන තැනක්. ඒ නිසා සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැරව, ඒ චරිතයට කළ හැකි කැපවීම, දිය හැකි දායකත්වය ගැන හිතලා චරිත තෝරා ගත්තා. ඒ හැර මහා සිවිල් බලයක් තියෙන චරිතවලට වඩා, මට ඕනෑ වුණේ මගේ නිර්මාණයට සාධාරණයක් කළ හැකි පිරිස තෝරා ගැනීම විතරයි. වඩාත් ප්‍රසිද්ධ නොවූ ශිල්පීන් වගේම, සම්මානනීය නළු-නිළි පිරිසකුත් මොනාලිසාට දායකව සිටිනවා. අද සමහර අය පුරුදුවෙලා ඉන්නෙ කලබලයට ඇවිත්, දෙබස් පාඩම් කරගෙන කැමරාව ඉදිරියේ පෙනී හිටලා යන්නයි. ඒත් ඊට වඩා චරිතයට සාධාරණයක් කළ හැකි පිරිසක් ඕනෑ වුණා.

**• එහෙම නැතුව, අතිශය ජනප්‍රිය තරු නොගත්තෙ, ලොකු මුදලක් ගෙවන්න සිදුවන නිසා නෙවෙයිද?**

කොහොම බැලුවත් අද වන විට අපේ රටේ සිනමා කර්මාන්තය කුඩා වෙලා තියෙන්නෙ. ඒ නිසා පිරිවැය, බජට් එක ගැන දෙපාරක්, තුන් පාරක් හිතන්න වෙලා තියෙන්නෙ. ඒ වගේම අපේ රටේ දක්ෂතා ඇති, අවස්ථා නොලැබෙන පිරිසකුත් ඉන්නවා. මෙහි සංගීත අධ්‍යක්ෂවරයාත් අලුත්. ඔහුගෙ නම එන්.එම්.ජේ. වසයිලාවො. ඒ විදියට විවිධ අංශවල දායක වන අලුත් දක්ෂයින් හඳුන්වාදීම කරනවා. සූර්යා දයාරුවන් සහ මාෂි මධුභාෂිණී ගායනයෙන් දායක වෙනවා. මේ චිත්‍රපටයේ දී පිරිවැය ගැන හිතන්නම ඕනෑ වුණා. මොකද මේ වැඩේ අපි පටන් ගත්තෙ කවුරුවත් චිත්‍රපටයක් කරන්න හිතන්නෙවත් නැති කාලයක. අද ප්‍රේක්ෂකයන් බලාපොරොත්තු වන්නෙ, අලුත් දෙයක්, අලුත් වෙනසක් මේ චිත්‍රපටයේ තියෙන බව කියන්න පුළුවන්.

## 'බජට්' ගැන දෙතුන් වතාවක් හිතන්න වෙනවා

## 'මොනාලිසා' වෙනස් අත්දැකීමක්

වෙනස් අත්දැකීමක් කිව්වොත් හරි. ඒ වගේම මේ චිත්‍රපටය තිරගත වෙන්නෙ ඉතාම අභියෝගාත්මක මොහොතක.

**• මොකද්ද ඒ අභියෝගය?**

මේ දිනවල දිනපතා විදුලිය විසන්ධි වෙනවා. බහුතරයක් සිනමාශාලාවල ජෙනරේටර්ස් නැහැ. ඉන්ධන, ප්‍රශ්න, විදුලියෙ ප්‍රශ්න සහ වෙනත් ආර්ථික ප්‍රශ්න එක්ක මිනිස්සු ඉන්නෙ. මේ කරුණු කාරනා අතරේ මේ චිත්‍රපටය තිරගත වෙන්නෙ. කෝවිඩ් සමයේ දී අපි ලැබූ අත්දැකීම තවදුරටත් පරණ කරලා තියාගන්න. මට ඕනෑ වුණේ නැහැ. ඒ නිසා දෙවසරක් ඇතුළත දී චිත්‍රපටය නිමවා, ප්‍රදර්ශනයටත් කටයුතු සැලැසුවා.

**• නිෂ්පාදකයන් දෙදෙනා ඔබ කෙරෙහි විශ්වාසය තැබුව ද?**

පැහැදිලිවම ඔවුන් දෙපොළ මා ගැන සහ මේ නිර්මාණය ගැන විශ්වාසය තැබුවා. ඒ නිසයි එයාලා මුදල් ආයෝජනය කළේ. කොහොම වුණත් චිත්‍රපටය තවම ප්‍රදර්ශනය වෙනවා. ලාභ- අලාභ ගැන තවම අපට කියන්න බැහැ. මොකද අද චිත්‍රපටයක් නරඹන්න තියෙන එකම තැන සිනමාශාලාව විතරක් නෙවෙයි. චිත්‍රපට නරඹන්න විකල්ප මාධ්‍ය බිහිවෙලා. එදා අපට සිනමා ශාලා 300ක් පමණ තිබුණා. අද ඒක 45ක් තරමට පහත බැහැලා. මණ්ඩල පහේම චිත්‍රපට බෙදා හරින්නෙ ඔය ශාලා 45ට. එකම සිනමා ශාලාවල එක්- එක් චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමට. 'ෂෝ- ටයිම්' දීලා තියෙන්නෙත් ඒකයි. අද චිත්‍රපටයක් නරඹන්න ප්‍රේක්ෂකයන් ගෙන්වා ගැනීම ඇත්තටම අභියෝගයක්. නමුත් මේ මොනාලිසා නරඹන පිරිස, පටන් ගත් තැන සිට, අවසානය දක්වා චිත්‍රපටය ඉතා ආසාවෙන් වින්දනය කරන බව නම් කියන්න පුළුවනි.

සඳුන් ගමගේ

# දුලිකා 'අයිරා'ට සමුදෙයි

**මේ දිනවල විකාශය වන ටෙලි නිර්මාණ අතර 'කියාදෙන්න ආදරේ තරම්' කියන්නෙ බොහෝ දෙනෙක් අතර ජනප්‍රිය නාට්‍යයක්.මේ නාට්‍යයේ චරිත අතරින් 'අයිරා' කියන්නෙ වැඩිම කතාබහකට ලක්වුණු ප්‍රේක්ෂක ආදරය ආකර්ෂණය වැඩි වශයෙන්ම හිමි වුණු චරිතයක්. නමුත් හදිසියේම මේ චරිතය නාට්‍යයෙන් සමුගැනීම නිසා බොහෝ දෙනෙක් ඒ සම්බන්ධව දුක් වුණේ ඒ චරිතයට සැබෑවටම ආදරය කරපු නිසා. අයිරා මේ තුළින් සමුගත්තේ ඇයි? ඇත්තම කතාව දැනගන්න සඳැල්ලෙන් මෙවර අපි දුලිකා මාරපන නම් ඒ දක්ෂ රංගන ශිල්පිනියව කතාබහකට එකතු කරගත්තා. ඒ සම්බන්ධව ඇට දැක්වූයේ මෙවන් දෙයක්.**



**• අයිරා නැතිව පුංචි තිරය පාළුවට ගිහින් නේද?**

"මමත් හිතනවා ඒක එහෙම ඇති කියලා ගොඩක් දෙනෙක් දක්වන ප්‍රතිචාරවලින්. මොකද අයිරාට පෙම් බැඳි බොහෝ ප්‍රේක්ෂක පිරිසක් හිටියා. විශේෂයෙන්ම අයිරාට සහ අයිරාගේ පවුලට. අපි රෙදිමෝලවත්තෙ ලස්සන පවුලක් හැදුවා. නමුත් ඉතින් ඕනෑම පැණි වරකා ගහකට හෙණ ගහනවා කියලා කතාවටත් කියනවනේ. ඉතින් අයිරාගේ පවුලටත් හෙණයක් ගැහුවා කියලා තමයි කියන්න තියෙන්නේ."

**• ඇත්තටම මොකද වුණේ?**

"මුලින්ම කියන්න ඕනෑ අපි 'කියාදෙන්න ආදරේ තරම්' නාට්‍යය කරද්දී ඉතාම දුෂ්කර කාල සීමාවක් පසු කළා. කොරෝනාවලට රට ලොක්ඩවුන් කරලා තියෙද්දිත් අපි රූගත කිරීම් යෙදිලා තිබුණත් නැහැ, බැහැ නොකියා ගිහින් ඒ වැඩ කටයුතුවල නිරත වුණා. අපි ලොකු අවදානමක් අරගෙන එහි වැඩ කරගෙන ගියේ. අනිත් ශිල්පීන්ට මාස්ක් දාගෙන වැඩ කරන්න හැකියාවක් තිබුණත් රංගන ශිල්පීන්ට ඒ දේ කරන්නත් බැහැනේ. නමුත් ඒ හැමදේම නොතකා මේ නිර්මාණය වෙනුවෙන් කැප කළේ. ඉතින් ඒ වගේ දුෂ්කර කාලයකුත් පසු කරගෙන අපි කොහොම හරි ඉදිරියට ආවනේ. නමුත් මේ නිර්මාණය පටන් ගත්තු කාලෙ ඉඳන්ම අසාමාන්‍ය දුෂ්කරතා කිහිපයක් තිබුණා. ඒවා ඉතා බරපතළ තත්ත්වයන්. විශේෂයෙන් කියන්න ඕනෑ අපි මේ රූගත කිරීම් සිදු කළේ වත්තකනේ. ඉතින් ඒ දුෂ්කර ජීවිතය හරි කටුකයි. වහිද්දි ගලි වළවල් උතුරනවා. කුණු කානු උතුරනවා. ඒ වගේ හරිම ඛේදනීය තත්ත්වයක තමයි මේ රූගත කිරීම් සිදු කරගෙන ගියේ. මට එක්තරා අවස්ථාවක විෂබීජයක් ඇතුළු වෙලා කකුලෙ පුංචි තුවාලයක් ඇවිල්ලා බරපතළ තත්ත්වයකට පවා මුහුණ දෙන්න සිද්ධ වුණා. නමුත් ඒ සියල්ල මැඩගෙන මම ඒ චරිතයට සාධාරණයක් ඉෂ්ට කරන්න ඇප කැප වෙලා ක්‍රියා කළා. අපි රංගන ශිල්පීන් විදිහට පාර තොටේ වෙන්න පුළුවන්, හිඟා කන චරිතයක් හෝ විවිධ චරිත රංගනයන්ට යන්න පුළුවන්. නමුත් අපි ඇත්තටම ජීවත් වෙන්නෙ ඒ පරිසරවල නෙමෙයිනේ. ඉතින් ඒ රූගත කිරීම් කරද්දී සමහර දේවල් ඉවසන්න වෙනවා. නමුත් ඉවසන්නම බැරි දේවලුත් තියෙනවනේ. විශේෂයෙන්ම මිනිස්සුන්ට අත්‍යවශ්‍ය වැදගත්ම දේවල් තියෙනවනේ. මනුස්සයෙක්ට කන්න බොන්න පිරිසිදු තැනක් ඕනෑ. ඒ වගේම විශේෂයෙන් කාන්තාවකට ඇඳුමක් මාරු කරගන්න, බහිශ්‍රාවය කරන්න සුදුසු පිරිසිදු තැනක් අත්‍යවශ්‍යයිනේ. ඒ දේ කාන්තාවකගේ අයිතිවාසිකමක්. ඉතින් ඒ අවම අවශ්‍යතා ටිකවත් සපුරන්න බැරි නම් තව



තවත් එතැන රැඳෙන්න පුළුවන් ද? තමන් වැඩ කරන කාල පරාසය තුළ ඒ දේවල් ලැබෙන්නෙ නැත්නම් කොහොම ද වැඩ කරන්නෙ? ඒ දේවල් තවදුරටත් ඉවසන්න බැරි වුණු තැන මම ඒ තුළින් ඉවත් වෙන්න හිතුවා."

**• ඒ සම්බන්ධව අදාළ පාර්ශ්වයන් එක්ක කතාබහ කළේ නැද්ද?**

"මුලින්ම මම ආයතනයත් එක්ක කතා කළා. ඔවුන් කිව්වා නිෂ්පාදන කණ්ඩායමත් එක්ක කතා කරන්න කියලා. ඒ අදාළ පාර්ශ්වයන් සියල්ල එක්ක කතා කළත් වැඩක් වුණේ නැහැ. කතා කිරීමෙන් හෝ ඉවසීමෙන් විසඳගත නොහැකි නම් යම් ගැටලුවක්, එතැන තවත් රැඳිලා ඉන්න එකේ තේරුමක් නැහැ. තරහ අරගෙන වැඩකුත් නැහැ. මොකද 'කියාදෙන්න ආදරේ තරම්' කියන්නෙ මගේ ජීවිතේ කරන අවසාන රංගනය නෙමෙයිනේ. නමුත් මම දිගින් දිගටම මේ නිර්මාණයේ හිටියා නම් ඒක මගේ ජීවිතේ කරන අවසාන රංගනය බවට පත්වෙන්න තිබුණා. මොකද ඒ තරමට මානසික පීඩනයක හිටියේ. ඒ නිසාම තමයි මේ තුළින් ඉවත් වෙන්න තීරණය කළේ."

**• දුලිකාගේ හදිසි ඉවත් වීම ප්‍රේක්ෂකයන්ට කරන අසාධාරණයක් කියලා හිතෙන්නේ නැද්ද?**

"ඇත්තටම මම ඒ සම්බන්ධයෙන් මගේ ආදරණීය ප්‍රේක්ෂකයන්ගෙන් සමාව ඉල්ලනවා. මොකද අයිරා කියන්නෙ 100%ක් මා විසින් නිර්මාණය කරපු චරිතයක්. මම ඒ වත්තෙ ඉඳලා ඔවුන් එක්ක ගැවසිලා ඔවුන්ගෙ ඇවැතුම් පැවැතුම්, අඳින පළඳින ඒ හැමදේම බලලා ඒ සියල්ල පිටපත් රචකයා එක්ක කතාබහ කරලා සාකච්ඡා කරලා ඔහුගේ පිටපතේ චරිතෙට වඩා වෙනස් දෙයක් මම ඒ හරහා ප්‍රතිනිර්මාණය කළා. අභව්‍ය නොවන යථාර්ථයේ ජීවත්වන යථාර්ථවාදී රියැලිටියේ ඉන්න චරිතයක් හැදුවා. අද නාළිකාව පවා කියන්නෙ මේ චරිතය දුලිකා විසින් ප්‍රතිනිර්මාණය කරපු එකක් කියලා. ඉතින් මේ චරිතයට ආදරය කරපු බැඳිලා හිටපු බොහෝ පිරිසක් හිටියා. ඇත්තටම මටත් මාරම දුකයි මේ චරිතයෙන් ඉවත් වීම ගැන. මොකද මම හදපු, වඩපු දරුවෙක් බෙල්ල මිරිකලා මරලා දැම්මා වගේ හැඟීමක් මට තියෙන්නේ."

## දුලිකා මාරපන

**• බොහෝ දෙනෙක්ගේ මතය වුණේ ඔබ මේ චරිතයේ ජීවත් වුණා, වෙනත් රටකින් නිළියක් ගෙනාවත් ඔබේ රංගනයට සම කරන්න බැහැ කියන දේ?**

"ඔව්, ඇත්තටම ගොඩක් දෙනෙක් ඒ දේ කිව්වා. චරිතය මරලා දාන්න තිබුණා කියන දේත් බොහෝ දෙනෙක් සඳහන් කරලා තිබුණා. මමත් ඇත්තටම ඒ දේ පිටපත් රචකයාට දැනුවත් කළා. මම ඉල්ලීමක් කළා ලොකු පුතාට හෝ තියන වෙඩිල්ලක් තියලා මාව මරලා මේ චරිතෙ මෙතනින් ඉවත් කරන්න කියලා. නමුත් ඉතින් ඒ දේවල් සිද්ධ වුණේ නැහැ. ගොඩක් අයට අපේ මේ රංගනයන්හි කරන කැපකිරීම්වල වටිනාකමක් නැහැ කියලා තමයි මට නම් කියන්න තියෙන්නේ. මුලින් මගේ ආදරණීය ප්‍රේක්ෂකයෝ ගැන හිතලා දරාගෙන හිටියත් ඉන්නම බැරි තැන තමයි මේ තීරණය ගන්න වුණේ. අපහසුතාවකින් තොරව වැඩ කරන්න ඕනෑ පරිසරයක් හදලා දුන්නා නම් අපිත් සතුටින් වැඩ කරගෙන යනවනේ. මමත් නිෂ්පාදන කළමනාකාරවරියක් සහ නිෂ්පාදකවරියක් විදිහට වැඩ කරනවා. එහිදී මම මගෙත් එක්ක වැඩ කරන කලාකරුවන්ට අපහසුවක් දැනෙන්න කවදාවත් වැඩ කරලා නැහැ. ඒ දේ වෙන්න ඕනෑ. එතකොටයි නිර්මාණයක සාර්ථකත්වය තියෙන්නේ. ජනප්‍රියත්වය පසුපස හඹා යාමම නෙවෙයි වෙන්න ඕනෑ. ඒ පසුපස යන්න ඕනෑ. නමුත් කොලිටියක් තියාගෙන."



**• ඔබ වෙනුවට මේ චරිතයට සම්බන්ධ වුණු රංගන ශිල්පිනියගෙ රංගනයන් දැක්කා ද?**

"ඇත්තටම මම දැක්කෙ නැහැ. මට බලන්න වුවමනාවක් තිබුණෙත් නැහැ. මම සාමාන්‍යයෙන් ටෙලිනාට්‍ය බලන කෙනෙකුත් නෙමෙයි. මම දන්නෙ මම කරපු කර්තව්‍යය ගැන විතරයි. ඉතින් මම ගොඩනගපු චරිතය ප්‍රේක්ෂකයො ආදරයෙන් වැළඳ ගත්තා. ඒකට ගොඩක් සතුටුයි. ඉතින් මේ චරිතයෙන් ඉවත් වීම ගැන ඇත්තටම දුකයි. මම සාමාන්‍යයෙන් චරිතයක් බාර ගත්තම ඒ දේ අතරමගදී දාලා යන ප්‍රමාණය අඩුයි. දරාගන්නට බැරි හේතුවක් ආවොත් තමයි එහෙම වුණොත් වෙන්නේ. නැත්නම් රූගත කිරීම් කරද්දි වුණත් මම හරිම විනෝදෙන් ඒ වැඩ කටයුතු කරගෙන ඉන්න කෙනෙක්. දැන් මේ වෙනුවෙන් දායක වෙලා ඉන්න රංගන ශිල්පිනියත් රටේ ඉන්න දක්ෂ ශිල්පිනියක්. ඇයගෙ වපසරිය ඇතුළෙ ඇය ඉන්නවා. ඉතින් ඇයගෙ රංගනයේ සාර්ථක අසාර්ථක බව ප්‍රේක්ෂකයන්ට බාර කාරණාවක්. මට ඒ ගැන කියන්න ලොකු දෙයක් නැහැ."

## පැණි වරකෙටත් හෙන ගහනවනෙ

**• මේ නාට්‍යයෙන් ඉවත් වීමත් සමග දුලිකා මාරපන රංගන ශිල්පිනියට කොයි තරම් ආදරය කරන පිරිසක් ඉන්නවා ද කියන දේ වැටහෙන්න ඇති?**

"අම්මෝ ඒක මම දැකලා තියෙනවා. මම මොන නාළිකාවක වැඩ කළත් මගෙත් එක්ක රැඳිලා ඉන්න ප්‍රේක්ෂකයො පිරිසක් ඉන්නවා. ඒ ආදරේ තමයි අපිව ජීවත් කරවන්නේ. ඉතින් ඒ ආදරය දිරිගැන්වීම ආශිර්වාදය එදත් අදත් හෙටත් තියෙනවා, තියෙයි කියන විශ්වාසය මට තියෙනවා."

ධනු විජේරත්න

ඡායාරූප - ලක්මාල් සිංහාරගේ

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2022 මාර්තු මස 13 වැනිදු ඉරිදු එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී